

# السعادة

# සෞභාග්‍යමත් ජීවිතය

باللغة السنهالية

# සෞභාග්‍යමත් ජීවිතය

දාර් අල් වතන්හි ප්‍රකාශනයක්

සිංහලෙන්
අබ්දුල් හකීම් මුහියිද්දීන්

නිරීක්ෂණය
මුහම්මදු නාසිම්

ح المكتب التعاوني للدعوة والارشاد بالشفا ، ١٤٢٤ هـ

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

دار الوطن ، ( الرياض )
السعادة . .- الرياض، ١٤٢٤ هـ
٥٦ ص، ١٢×١٧ سم
ردمك: ٣ ـ ٥١ ـ ٨٤٣ ـ ٩٩٦٠
(النص باللغة السنهالية)
١ ـ الوعظ والارشاد ٢ـ السعادة أ. محي الدين، عبد الحكيم
(مترجم ) ب. العنوان
ديوي ٢١٣ ١٤٢٤ / ٧٧

رقم الإيداع : ٧٧ / ١٤٢٤
ردمك : ٣ ـ ٥١ ـ ٨٤٣ ـ ٩٩٦٠

حقوق الطبع محفوظة

١٤٢٤هـ ـ ٢٠٠٣ م

# بسم الله الرحمن الرحيم

මහා දයාන්විත අති කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙන්

පැසසුම් සියල්ල සර්වඥාන අල්ලාහ්ට අයත්වේ. ඔහු ප්‍රශංසා කර ඔහුගෙන්ම සහාය පතා සිටිමු. අපගේ පාපයන් හට ඔහුගෙන්ම පව් සමා අයැදිමු. පව් සහ නින්දිත ක්‍රියාවන් හට ලක් නොවී සිටීමටද ඔහුගෙන්ම සහාය පතමු. කරුණාබර අල්ලාහ් පෙන්වන යහමග කවරෙකු හට ලැබෙන්නේද හෙතෙම නොමග යැවීමට කිසිවෙකුට කළ නොහැකිය. එමෙන්ම අල්ලාහ්ගේ යහ මග කවරෙකුට නොලැබෙන්නේද ඒ තැනැත්තා යහමග කිරීමට කිසිවෙකුට කළ නොහැකිය. තවද වැඳීමට සුදුසු එකම සත්‍ය දෙවියා අල්ලාහ් දෙවිඳු හැර අන් කිසිවෙකු නැති බවත්, මුහම්මද් තුමා අල්ලාහ්ගේ කීකරු අතවැසියා සහ අවසාන වක්තෘ වරයා බවත් මම සාක්ෂි දරමි.

මුළු මිනිස් සමාජයේම විවිධ රටවල, ප්‍රදේශවල, විවිධ දහම්වල, සිද්ධාන්තවල, භාෂාවන්වල, විවිධ රැකියාවන් වල සහ විවිධ වර්ණයෙන් යුත් මිනිසුන් ව්‍යාප්තව ජීවත් වෙති. ඔහුන් සැම කෙනෙකුගෙන්ම 'ඔබ ජීවිතයේ පරමාර්ථය කුමක්ද?' යනුවෙන් වූ වැදගත් ප්‍රශ්ණයක් මතු කල විට, ඔවුන් සැමගෙන්ම ලැබෙන එකම උත්තරය සෞභාග්‍යමත් ජීවිතයක් මත අප ජීවිතය ගොඩනැගීම අපගේ පරමාර්ථය වේ' යනුවෙන් වේ.

එහෙයින් ඒ සියලු දනන්ගේ පිළිතුරු මගින් මනාව අවබෝධ වන්නේ මුළු මිනිස් සමාජයේම එකම අභිලාෂය වී ඇත්තේ සන්තෘෂ්ටියෙන් පිරුණු සෞභාග්‍යමත් නිවහල්

ජීවිතයක් ගතකිරීම වේ යන්න සක්සුදක්සේ පැහැදිලිය. නමුදු ඒ සතුටෙන් පිරුණු සෞභාග්‍යමත් ජීවිතය මුළු මිනිස් සමාජයේම එකම අභිලාෂය බව වැටහෙයි. එහි අවසාන ඉලක්කය සහ බලාපොරොත්තුව නිත්‍ය ස්වර්ගය වේ යන්න නොරහසකි.

නමුදු සත්‍ය විශ්වාස වන්තයෙකු තම ස්ථිරසාර විශ්වාසය තුලින් ඒ සෞභාග්‍යමත් ජීවිතය ලබා ගැනීමට උත්සාහ දරන්නේය.

සත්‍ය විද්‍යාමාන දේව විශ්වාසය ප්‍රතික්ෂේප කරන මිසදිටුවාද තම ප්‍රතික්ෂේප සංකල්පය තුලින් සෞභා ග්‍යමත් ජීවිතයක් ලබා ගැනීමට උත්සාහ කරන්නේය.

සොරෙකු තම සොරකම් කිරීමේ වෘත්තිය තුලින්, ධනය වර්ධනය කර ඒ විශාල ධනය සම්භාරය තුලින් සතුටෙන් පිරුණු සෞභාග්‍යමත් සන්සුන් ජීවිතයක් ලබා ගැනීමට වෙර දරන්නේය. දුරාචාරය තම වෘත්තිය ලෙස කරන්නාද දුරාචාරයේ හැසිරෙමින් සියල්ලෙන් පිරුණු සෞභාග්‍යමත් සන්සුන් ජීවිතයක් ලබා ගැනීමට උත්සාහ දරන්නේය.

මුදල්හදල් සහ සම්පත් එකතු කිරීමෙහි නිරතව සිටින්නාද එසේ ධනය එකතු කිරීම තුලින් සතුටෙන් පිරුණු ඒ සෞභාග්‍යමත් ජීවිතය ලබාගැනීමට හැකි සෑම උත්සාහයක්ම දරන්නේය.

උසස් තනතුරුවල නිරතව සිටින්නාද ඒ තනතුරු සහ තත්ත්වය තුලින් අති උසස් සෞභාග්‍යමත් සන්සුන් ජීවිතයක් ගොඩ නගා ගැනීමට උත්සාහ දරන්නේය.

බොහෝ බාධක මැද්දේ විවිධ රටවල් අතර විවිධ කාලවල සහ විවිධ අභිලාෂයන් හේතු කොටගෙන

ගමන් කරන්නාද තම සංචාරය තුලින් සෞභාග්‍යමත් ජීවිතයක් තමා සතු කරගැනීමට උත්සාහ දරයි.

තත්ත්වය, නිලය සහ කරන කටයුත්ත කුමක් වූවද, කුමණ අවස්ථාවක වූවද සෑම දෙනාගේම එකම අභිලාෂය, ඉලක්කය වී ඇත්තේ සදා සතුටෙන් පිරුණු සන්තෝෂ්ටිමත් ජීවිතයක් යන්න මනාව පැහැදිලි වේ. නමුදු මිනිසුන් ගෙන් බොහෝ දෙනෙකු නියම සෞභාග්‍ය යනු කුමක්ද, එය ලබාගැනීමට හැකි මාර්ගය කුමක්ද යන්න මනාව වටහා ගැනීමට තවමත් අපොහොසත් වී ඇත. මිනිසුන් ගෙන් බොහෝ දෙනෙකු ලෞකික ජීවිතයේ සතුටක් සහ මිහිරක් ලැබුණු හැඟීමකින් ජීවත් වූවද, අන් මාර් ගයකින් ඔවුන්ගේ සිත්තුල කිව නොහැකි භීතියක්, චංචලයක්, වේදනාවක් සහ අඩු කමක් භූතාකාර අන්දමින් අරක් ගෙන ඔවුන් විඳිමින් පසුවන සාමාන්‍ය සතුට සහ මිහිර විටින්විට අඩපන කරයි. එයට වඩා ඒකාන්තයෙන්ම අනාගතයේදී සිදුවිය හැකි, නොවළක්විය හැකි, තමා වෙත ළඟාවීමට කිසිසේත් අකැමැති මරණය ගැන කිව නොහැකි විශාල බියක්ද මිනිසා තුල අරක් ගෙන ඔහු දුකට සහ වේදනාවට පත් කරයි.

මිනිසාට කවදා හෝ සිදුවිය හැකි මරණය ගැන ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

﴿قُلْ إِنَّ الْمَوْتَ الَّذِي تَفِرُّونَ مِنْهُ فَإِنَّهُ مُلَاقِيكُمْ ثُمَّ تُرَدُّونَ إِلَى عَالِمِ الْغَيْبِ وَالشَّهَادَةِ فَيُنَبِّئُكُم بِمَا كُنتُمْ تَعْمَلُونَ﴾

'ඔබ කුමක් වෙතින් (විශාල බියකින්) පලා දුවන්නේ ද, ඒ මරණය (මිනැම මොහොතක) ඔබ හමුවන්නේ මය. ඉක්බිති දෘශමාන සහ අදෘශයමාන දේහී ඥානය

ඇත්තා (වන අල්ලාහ් දෙවිඳු) වෙත ආපසු පමුණුවනු ලබනු ඇත. (මිහිපිට) ඔබ කරමින් හුන් (සියලු) දේ ගැන (ඒකාන්තයෙන්ම ඔහු ඔබට) දන්වන්නේ යයි කියනු මැනව'. (අල්කුර්ආනය 62 : 8)

## වත්මන් ලොව

තමා සඳහාටම බුක්ති විඳිය යුතු සතුටක් තමා සතු කරගන්නේ කෙසේද යන්න හරිහැටි වටහා ගැනීමට අපොහොසත්ව වත්මන් ලොවේ මිනිසා කිව නොහැකි භීතියකින්, චංචලයකින්, එක්තරා සිත් වේදනාවකින්, කිසිදු සතුටකින් තොරව හුදෙක් සංවේගයකින් සහ ප්‍රහෙලිකාවකින් පිරුණු ජීවිතයක් ගත කරයි. සඳහාටම බුක්ති විඳිය හැකි නියම සතුට යනු එය කුමක්දැයි ස්ථිරසාරව වටහා ගැනීමෙන් විනා පහසුවෙන් විසඳුමක් සොයා ගන්නට නොහැකි අපැහැදිලි එකක් යැයි කීවා නම් එය අසත්‍යයක් නොව. වත්මනයේ මිනිසුන් අතර, විශේෂ වෛද්‍යවරුන්ට පවා සුව කළ නොහැකි, මෙය යැයි ස්ථිරව පහසුවෙන් හඳුනා ගෙන කිව නොහැකි, මර්ධනය කළ නොහැකි ලෙඩ රෝග අපමණය. ඒවා කෙසේ බිහි වනවාද කෙසේ පැතිරෙනවාද, ඒවාට සුදුසු ප්‍රතිකාර මොනවාද යන්න හරිහැටි දැනුමක් ලබා ගැනීමට පවා වෛද්‍ය ලොව තවමත් සමත් වී නැත.

වත්මන් මිනිස් සමාජයේ අස්සක් මුල්ලක් නැර හොල්මන් කරමින් බිය ගන්වන විශාල වසංගතයක් බවට ඒඩ්ස් රෝගය පත්වී ඇත. එයට අවුරුදු පතා බිලිවන්නන්ගේ සංඛ්‍යාවද, මරණ මුඛයට ලඟා වෙමින් සිටින අයගේ සංඛ්‍යාවද අති විශාලය. එසේම ක්ෂය රෝගය බොහෝ කාලයක් තිස්සේ මිනිස් ජීවිත මිලියන ගණනින්

ගොදුරු කරගනිමින් මුළු මිනිස් සමාජයටම අභියෝග කරන තවත් රෝගයක් ලෙස හැඳින්විය හැකිය.

තවද විවිධ හේතු මත ඇති වන පරිසර දූෂණය වීම සහ මිනිසාගේ නරක පුරුදු වැනි හේතු නිසා බිලිවන මිනිස් ජීවිත ගණන අනන්ත අප්‍රමාණය.

විවිධ මාර්ගයෙන් නිෂ්පාදිත මත්පැන, මත්ද්‍රව්‍ය සහ අනෙකුත් අයුරෙන් වූ මත් ද්‍රව්‍යයන් විසින් වසරක් වසරක් පාසා බිලිවන මිනිස් ජීවිතද අනන්ත අප්‍රමාණය.

ක්‍රමානුකූල නොවූ වැරදි නුසුදුසු කායික සංසර්ගය සහ අයතා සංවාසයන් පවා මිනිස් ජීවිත සිය දහස් ගණනින් බිලිවීමට තවත් හේතුවකි.

දවසින් දවස විවිධ අන්දමින් වැඩිවෙමින් පවතින විවිධාකාර අනන්ත අප්‍රමාණ වැරදි, අපරාධ, අනතුරු සහ කොලාහල මගින් විනාශ වන වටිනා මිනිස් ජීවිත කෝටි ගණන් යැයි කිව හැකිය.

දේශ සීමා අරගල සහ අනෙකුත් අසල් වැසි රටවල් අතර සිදුවන යුද්ධ සහ ඒ වෙනුවෙන් පාවිච්චි කරන අනතුරුදායක විවිධ විෂ ආයුධ සහ ආයුධ නිෂ්පාදනය කර පරීක්ෂා කිරීම වැනි හේතුන් නිසා විනාශ වන මිනිස් ජීවිත කිව නොහැකි තරම් වේ.

පරිසර දූෂණය වන නිසාද, දුප්පත්කම නිසාද, මන්ද පෝෂ්‍ය ආහාර සහ නුසුදුසු ආහාර පාවිච්චිය නිසාද දිනෙන් දින වැඩිවෙමින් පවතින මිනිස් ජීවිත නාස්තියද තවත් විශාල ප්‍රමාණයකි.

එසේනම් සියල්ල විපරමෙන් බලන කල සෑම පැත්ත කින්ම මිනිස් ජීවිතයට විශාල තර්ජනයක් හානියක් වේ නම්, මෙය කුමන මාදිලියේ ජීවිතයක්ද, ලොවක්ද? මෙසේ සියලු පැත්තෙන්ම මිනිස් ජීවිතයට තර්ජනයක්ව පවතිද්දී අප ලෞකිකව විඳින සිත් සතුට, සෞභාග්‍යමත් ජීවිතය සහ සමෘද්ධිය කුමක්ද? මෙසේ දුක් ගැහැට විශාල සාගර රැලිමෙන් එකක් පිට එක අඛණ්ඩව, අනන්ත අප්‍රමාණව පැමිණ මිනිස් සිත සන්තාපයෙන්, සන්ත්‍රාස යෙන්, භීතියෙන්, සැකෙන් පිරුණු කල මිනිස් ජීවිත කළකිරෙන්නට හැකිය. මෙසේ විශාල බාධක මැද්දේ යමෙකු ජීවත්වන කල සමහරවිට මහුට මිහිපිට ජීවත්වීම පවා ප්‍රහෙළිකාවක් විය හැකිය. එසේ නම් මිනිසාගේ සන්තෘෂ්ටිමත් ජීවිතයක් පිණිස තෝරා ගෙන පිළිපැදිය යුතු මාර්ගය කුමක්ද, සන්තෘෂ්ටිමත් ජීවිත යක් ගත කිරීමට ඇති සුදුසු ජීවනමග කුමක්ද යනු වෙන් උත්තර සොයමින් ලතවන ප්‍රශ්ණ කීපයක ඉදිරි යෙහි මිනිසා මුනිවත රකිමින් සිටියි.

## බටහිර ලොව

වත්මනයේ බොහෝ දෙනෙකු බටහිර ලොව හඳුන්වා දෙන සිරිත්විරිත් සහ ගති පැවතුම් කෙරෙහි විශේෂ උනන්දුවක්, ලැදියාවක් දක්වයි. ඒවා මිනිසාට පිළිපැදිය හැකි බව සිතා උසස් ලෙස තම සිත් තුල බහා තක්සේරු කර බලා පිළිපෑදීමට උත්සාහ කරති. එසේම ඔවුන් දෙස භාහිරව බලා ඔවුන් සතුටෙන් ආරක්ෂාවෙන් නිදහසෙන් සන්සුන්ව තම ජීවිතය ගෙවමින් සිටිතියි සිතා අප ඔවුන් දෙස බලන්නේ අති සතුටකිනි. අති සම්භාවණීය අන්දමිනි. නමුදු අප ඔවුන්ගේ ජීවිතය

ඔවුන්ගේ ක්‍රියා කලාපය සහ ඔවුන්ගේ සමාජ තත්වය දෙස මදක් විපරමින් බලන්නේ නම් එහි තත්ත්වය අප සිතනවාටත් වඩා අති අන්ත ගරා වැටුනු එකක් බව පැහැදිලි වනු ඇත. ඒවා ඒ රටවල්වල ජනසන්නිවේදන මාර්ග සහ අනෙකුත් ප්‍රවෘත්ති මාර්ගයම විස්තර කර අපට දැනුම් දෙයි.

## මහා බ්‍රිතාන්‍ය

මහා බ්‍රිතාන්‍යයේ ප්‍රවෘත්ති සේවාවක් එහි මහජන යන්ගේ ජීවිතයේ සමාජ තත්ත්වය ගැන පුළුල් අන්ද මින් සමීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල මෙසේ විස්තර කර ඇත. ඒ විස්තර අතරින් මතු සඳහන් කරුණු කාගෙත් කුතුහලයට පත්වුනු කරුණු බවට පත් විය. සියයකට විස්සකටත් තිහකටත් අතර ප්‍රමාණයේ කාන්තාවන් සිදාදියේ ජීවත් වුවද, නොවන්නට ගම්බද ජීවත් වුවද දූෂණය සහ පැහැර ගෙන යෑම් වැනි කරදරවලට පත්වන හෙයින් බොහෝසෙයින් කාන්තා වන් තනිව නිවසින් පිටත්වී යෑමට පවා බියක් දක්වති.

එසේම කාන්තාව නිවසින් පිටවී අසල තැනකට පා ගමණින් යන්නට උවමනාවූ කල පවා සිව් දෙනෙකුට කෙනෙකු ආත්මාරක්ෂාව පිණිස තමා හා පිහියා සහ පිස්තෝල වැනි ආයුධ තම අත් බෑගය තුල සඟවා ගෙන රැගෙන යන බව ඒ සමීක්ෂණයේ වාර්ථාව වැඩි දුරටත් සඳහන් කරයි.

තවද රටේ ව්‍යාප්ත වී ඇති අපරාධවලින් ස්ත්‍රී දූෂණ වැනි අපරාධ පිටිසර පලාත්වල සියයට විසිහතරක් පමණ වන අතර ලන්ඩන් නුවර එය සියයට තිහක්

පමණ ඉහළින් පසුවන බව සඳහන් වේ.

## ඇමෙරිකාව

දියුණුවේ මුදුන් පෙත්තටම පත්වී ඇති ඇමෙරිකාව දියුණු මිනිසාට නිදහසේ ජීවත් විය හැකි රටක් යැයි අප කාගේත් නිගමණය වී ඇත. ඇමෙරිකානු එක්සත් රාධානියේ ප්‍රවෘත්ති පත්‍රයක් වන 'නිව්ස් වීක්' සඟරාව ඒ රටේ පවතින අපරාධ ගැන අපේ නිගමණයට ඉඳුරාම වෙනස් අදහසක් මෙසේ විස්තර කරයි. '1994 වසරේ පොදුවේ එහි සමාජය ගැන සමීක්ෂණයක් කළ වාර්තා කරුවන්, කිසිදු පවුලක් තම ළමයින් තනියම මහපාරේ ගමන් කිරීමට හෝ ඇවිදීමට හෝ අනුමත නොකරයි. මන්දයත් මිනැම මොහොතක තම ළමයින් සොරකම් කර ගෙන යැමට හෝ පන්නා ගෙන යැමට හෝ බල හත්කාරකම් කිරීමට හෝ නොවන්නට මහමග ඇති විය හැකි වෙඩි තැබීම් වැනි කරදරවලට මුහුණ පෑමට සිදු වීමට හෝ වැනි අවස්ථාවන් අධික වී ඇති බව නිසාය.

එමණක් නොව, ඒ රටේ නිතර නිතර ඇති වන අපරාධ ගැන විශ්මයට පත්විය හැකි මතු සඳහන් කරුණුද ඒ වාර්ථාවේ සඳහන් වී තිබුණි.

වසර 1985-1993 කාලය තුල සියයට හතළිහක පමණ ළමයින් කිසිදු හේතුවකින් තොරව නිවස අසලද නිවසින් පිට අනිසි ගුටිබැටවලට භාජනය වී ඇත. මෙසේ නිතර වන අපරාධයන් සහ කරදර නිසා ඇමෙරිකාවේ ජීවත් වන ළමයින්ගෙන් අඩක් පමණ ඉතා බියෙන් කල් ගෙවති.

ඇමෙරිකාවේ සියයට හැට අටක් පමණ වූ මිනිමැරුම් වැනි දරුණු සාපරාධී ක්‍රියාවන් සිදුවන බව ඒ රටේ විශේෂ අපරාධ මර්ධන අංශය විස්තර කරයි. පෙර

වසරවල සියයට අසූවක් පමණ වූ ඒ අපරාධ 1993 වසරේ එයට වඩා කීප ගුණයක්ම වැඩි වී ඇත.

ඒ වසරේ පෙර වසරවලට වඩා විවිධ අන්දමේ සොරකම් සියයට පණස් දෙකකින්ද, පැහැරගෙන යෑම් සියයට විසි පහකින්ද අධික වී ඇත.

ඇමෙරිකාවේ ජීවත්වන පවුල්වල ළමයින්ගෙන් අඩක් පමණ මවුන්ගේ දෙමාපියන් පවුල් අවුල්වී දික්කසාද වී වෙන්වී ජීවත්වන හෙයින් දෙමාපියන්ගේ කෙනෙකුගේ යටතෙහි ජීවත් වෙයි.

එහෙයින් බටහිර චින්තන වාදියෙකු නිව්යෝර්ක් නගරයේ ජීවිතය ගැන විස්තර කරන කල 'ලස්සන පොරෝණයකින් පොරවන ලද පහත් ජීවිතයක්' යනුවෙන් වර්ණනා කර තිබීම එතරම් ආශ්චර්යමත් දෙයක් නොවෙයි.

## දුකද සැපද

සුප්‍රසිද්ධ සිනමා නිළියෙකු වන මර්ලින් මන්රෝ සිය දිවි නසා ගත් ඉහළ පෙලේ වැජඹුණු කාන්තාවකි. ඇගේ සියදිවි නසා ගැනීමට හේතුව සොයා ගැනීමේ සමීක්ෂණයක යෙදුනු කොමිටිය ඇය විසින් ඇගේ මිතුරියකට ලියන ලද ලිපියක්ද සොයා ගත්තේය. ඒ ලිපියේ, කිසිවිටෙක සිනමා ජීවිතයට ඇල්මක් නොදක්වන ලෙස ඇය තම මිතුරියට අනතුරු අඟවා තිබුණාය. ඔබ මහජනයන් විසින් ප්‍රශංසා කිරීම කෙරෙහි බිය වන්න. ඔබට සිනමා පුරයේ අය විසින් කිරීමට හැකි විවිධ කුමන්ත්‍රණ, කරදර සහ අපරාධ කෙරෙහි ප්‍රවේශම් වන්න. මන්දයත් හොඳ උසස් පවුලක ඉපදුනු මා මේ ලෝකයේ කැත ජීවිතයක් ගත කරන පහළ පෙලේ ගැහැණියක් විය හැකිය. සන්සුන්ව මවක් ලෙස සතුටෙන් පිරුණු ජීවිතයක්

ගත කරන්නට අවස්ථාවක් මට අහිමි විය. සියලු ජීවිතවලට වඩා සතුටු විවාහයකින් පසුව ගත කරන පවුල් ජීවිතය උසස් උතුම් සන්සුන් ජීවිතයක් බව මම පසුව වටහා ගත්තෙමි. සැබෑ සතුට ඇත්තේ සමාදානයෙන්, ප්‍රීතියෙන් ගත කරන පවුල් ජීවිතයක් තුළයි. සන්සුන් පවුල් ජීවිතය කාන්තාවකගේ පමණක් නොවෙයි මිනිස් සමාජයේම විශාල සතුටකි. (කාන්තා සඟරාව)

වරෙක චිත්‍රපට නළුවෙකු සහ ගායකයෙකු අතර ඇති වූ දුරකථන සාකච්ඡාවක් එක්තරා මැදපෙරදිග ගුවන් විදුලි සේවයක් විසුරුවා හැරියේය. එහි අසන ලද ප්‍රශ්ණයක් සහ එයට දුන් පිළිතුර මෙසේ වේ. 'ඔබ සතුටෙන් කල් ගෙවනවාද? යි මැද පෙරදිග සුප්‍රසිද්ධ ගායකයෙකු වන අබ්දුල් හලීම් සුප්‍රසිද්ධ හොලිවුඩ සිනමා නළුවෙකු වන ඔමාර් ෂෙරීෆ්ගෙන් විමසුවේය. එයට නළු ඔමාර් ෂෙරීෆ් 'මම ජීවිතයේ කිසිවිටෙක සතුටක් විඳපු බව නොහැගිමි'යි උත්තර දුන්නේය. සුප්‍රසිද්ධ අරාබි ගායක අබ්දුල් හලීම් කෙසේ වුවද, නළු ඔමාර් ෂෙරීෆ් කව් බෝයි චිත්‍රපට තුලින් ප්‍රසිද්ධ නළුවෙකු බව අප සියලු දෙනාම දන්නා කරුණකි.

නියම සතුට

සංක්ෂිප්තව කියනවානම් සෞභාග්‍යයෙන් පිරුණු නියම සතුට ලබා ඇත්තේ අප ඉහළ සඳහන් කළ අයගෙන් දුරස්ථ වූ සාමාණ්‍ය ජීවිතයක් ගත කරන එක් කොටසක් පමණක් බව සක්සුදක්සේ පැහැදිලි කළ හැකිය. ඔවුන් දුකෙන්, කරදරයෙන්, දුර්භාග්‍යයෙන් පිරුණු මාවතෙන් ඉවත්වී සදා සතුටෙන්, ප්‍රීතියෙන් පිරුණු මාවතක් ඔස්සේ ගමන් කරනවා යැයි කිව හැකිය. අනෙක් අය කිසි

විටෙක නොබැලූ සත්‍ය ගැලවීමේ මාවතක් දෙස බැලූ අය මොවුන්ය. මවුන්ගේ සැලකිල්ල සහ චින්තනයන් මෙලොව ජීවිතයෙන් ඉක්මවා මිනිසාගේ මරණයට පසු විය හැකි නිත්‍ය ජීවිතය කුමණාකාරද යන්න කෙරෙහි යොමු වී ඇත. මවුන් කවරෙක්දැයි මනාව වටහා ගැනීම අපගේ යුතුකමකි. මවුන් තම නිර්මාතෘවරයා වන සත්‍ය සර්වබල අල්ලාහ් දෙවිඳු විශ්වාස කර මහුට පමණක් වන්දනාමාන කරන්නන්ය. මහු විසින් තහනම් කළ දේ වෙතින් සම්පූර්ණයෙන්ම ඉවත්වීද, මහු විසින් පණවන ලද දේ ඒ ආකාරයෙන්ම සම්පූර්ණව ඉටු කරද, මහුගේ විශ්මිත මැවීම් ගැන නිදහසේ කල්පනා කර ඒවා වෙනුවෙන් ප්‍රශංසාමුඛව තුති පුදද, විශ්වයේ විසිරී ඇති මහුගේ අනන්ත අප්‍රමාණ සාධකයන් ගැන සිතා මහුගේ දිව්‍ය හෙළි කිරීම වන පරිශුද්ධවූ අල්කුර්ආන් ග්‍රන්ථය පාරායනය කරද, එය ආඥා කරන සියලු ආඥාවන් නිසි ලෙස පිළිපැදද, තම උවමනාවන් සියල්ල මහුගෙන් විවෘතව අයද මහු වෙතින් පමණක් ඉල්ලමින්ද, මහුගේ කරුණාව සහ දයාව ලබා මහුගේ තෘප්තිය පමණක් ආපේක්ෂාවෙන් කටයුතු කරන්නන්ය.

නමුදු මෙවන්නන්ගෙන් කෙනෙකු තම කුසගින්න නිවා ගන්නට අවශ්‍ය කෑම පවා වේලාවට නොලැබුණා වුවද, මහු සතුටෙන් ප්‍රීතියෙන් ලොවට සහ එහි ඇති දේවලට රජා නමා ලෙස තෘප්තිමත් වන්නේය. සර්වබල අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿قُلْ بِفَضْلِ اللَّهِ وَبِرَحْمَتِهِ فَبِذَلِكَ فَلْيَفْرَحُواْ هُوَ خَيْرٌ مِّمَّا يَجْمَعُونَ﴾

'අල්ලාහ්ගේ වරප්‍රසාධයෙන්ද ඔහුගේ දයාලුභාවයෙන්ද (මෙය ඔවුන් වෙත පැමිණ ඇත. එහෙයින්) එහි ඔවුන් සතුටු වෙද්දෙන්. ඔවුන් රැස්කර ඇති (සේසත් වැනි) දෙයට වඩා එය යහපත් යැයි (නබි තුමනි) ඔබ කියනු මැනව'. (අල්කුර්ආන් 10 : 58)

කවියෙකු මෙසේ විස්තර කරයි : මා සේසත් රැස් කරන විට සතුටට පත්නොවූවෙමි. නමුදු අල්ලාහ්ට බිය බැතියෙකු වන්නා සතුටු සමාධියක සුවය දකියි.

## ශ්‍රධාවන්තයන්ගේ මාර්ගය

ස්ථිරසාර සතුටක් ලබන්නට නම් කුමන මාර්ගයක් පිළිපැදිය යුතුද, කුමක් ගැන විශ්වාස කළ යුතුද, ඒ සඳහා කුමන මාවත සුදුසුද යනුවෙන් අද බොහො දෙනෙකු කල්පනා කරමින් පසුවන කල, ශ්‍රධාවන්තයෙකු කිසිසේත් එවැන්නක් ගැන අස්ථාවර අන්දමින් කල්පනා කර තම සිත අවුල් කර ගන්නේ නැත. එවැන්නක් ගැන සිතා දුක් වන්නේද නැත. මන්දයත් ඔහු ඒ මාවත මැනවින් දැනගෙන ඒ අනුව කටයුතු කරන්නෙක් නිසාය. එසේම සදා සතුටේ කාන්තිය සහ රශ්මිය සදා ඔහු පහන් කරමින් පසු වෙයි. ඒ මහා සතුට භුක්ති විඳිය යුතුය යන ආශාව අරභයා කටයුතු කරන කල ඔහුගේ මාවතේ ඇති වන සියලු දුක් කරදර සහ බාධකයන් ඉවසා ධෛර්යයෙන් ඉදිරියට යැමට ඔහු ඒවා සුදානම් කර ගන්නේය. එසේ කටයුතු කිරීමෙන් ඔහු ලඟාවීමට බලාපොරොත්තු වන ස්ථානයට යැම පිණිස අධියරෙන් අධියර පෙරට යන්නේය. ඔහු ඉතා පරිශ්‍රමයෙන් එක් අවස්ථාවක් පසු කරන විට බාධා පමුණුවමින් පසුකල

යුතු තවත් කටුක අවස්ථාවක් ඔහුගේ ගමන්මග හරහා වැටෙන්නේය. එසේ වූවද ඔහුතෙම ඒ මාවත හරහා ඇති වන දුක් සහ සියලු බාධක සුළුවෙන් තකා ඉවසා ඒ සතුට ලබා ගන්නට උත්සාහ කරන්නේය. එසේ උත්සාහ කරන විට තමාට අවසනාවන්ත යැයි සිතිය හැකි අන්දමින් මරණයක් ඇති වූවද එයින් ඔහුට ලෞකිකව කිසිවක් අහිමි නොවන්නේය. නමුදු ඒ වෙනුවට මරණින් මතු ලොවේ අවසානයක් නැති සතුටක ජයක් ඔහු අත්පත් කර ගන්නේය. එසේම අසංඛ්‍යාත දුක් කරදර මැද්දේ ධෛර්යයෙන් තම ගමන නොකඩවා කරගෙන යන කල ඔහු තවතවත් උසස් තුමුල තත්ත්වයකට පත් වන්නේය.

### වහි පණිවුඩය

නියම සතුට ලබා ගත හැකි මාවත වන්නේ සත්‍ය විශ්වාස වන්තයෙකු ගමන් කරන මාවත බවත්, නියම සතුටක් ලබා ගත හැකි එකම මාවත විශ්වාස වන්ත යෙකු ගමන් කරන මාවත බවත් සර්වඥාන දෙවිඳු අල්ලාහ් පරිශුද්ධ වූ අල්කුර්ආනය තුලින් මෙසේ විස් තර කරයි :

﴿وَأَنَّ هَذَا صِرَاطِي مُسْتَقِيمًا فَاتَّبِعُوهُ وَلَا تَتَّبِعُوا السُّبُلَ فَتَفَرَّقَ بِكُمْ عَن سَبِيلِهِ﴾

'ඇත්තෙන්ම මෙය මගේ සෘජුමාර්ගය වේ. එහෙයින් එය අනුගමනය කරනු. (මේ හැර) වෙන මාර්ග අනුගමනය නොකරනු. ඒවා ඔහුගේ ඒ (සත්‍ය) මාර්ගයෙන් ඔබ (පහසුවෙන්) ඉවත් කරනු ඇත'. (අල්කුර්ආන් 6 : 153)

මිනිසා ඉදිරිපිට මනාව පැහැදිලි කර දුන් මාවත් දෙකක් වේ. ඒකාන්තයෙන්ම ඔහු එයින් එක් මාවතක් පිළිපැදිය යුතුය. එසේ නම් අප ඉදිරියෙහි මහා ප්‍රශ්ණ දෙකක් වේ. ඒ ප්‍රශ්ණ දෙක, සම්පූර්ණ සතුට ලබන භාග්‍යවන්ත යන් අවසානයේ සෙන්දු වන ස්ථානය කරා යන මාවත කුමක්ද? සම්පූර්ණයෙන්ම අපරාජිතවූ කණස්සල්ලට පත් වූ දුර්භාග්‍යවන්තයන් අවසානයේ සේන්දු වන ස්ථානය කරා යන මාවත කුමක්ද? යන්න වේ. ඒ ස්ථානයන් දෙක මනා ලෙස පැහැදිලි කර නියම පිළිතුර සර්වබල දෙවිඳු අල්ලාහ් තම පරිශුද්ධවූ අල්කුර්ආනය තුලින් මෙසේ විස්තර කරයි :

﴿فَأَمَّا الَّذِينَ شَقُواْ فَفِي النَّارِ لَهُمْ فِيهَا زَفِيرٌ وَشَهِيقٌ، خَالِدِينَ فِيهَا مَا دَامَتِ السَّمَاوَاتُ وَالأَرْضُ إِلاَّ مَا شَاء رَبُّكَ إِنَّ رَبَّكَ فَعَّالٌ لِّمَا يُرِيدُ وَأَمَّا الَّذِينَ سُعِدُواْ فَفِي الْجَنَّةِ خَالِدِينَ فِيهَا مَا دَامَتِ السَّمَاوَاتُ وَالأَرْضُ إِلاَّ مَا شَاء رَبُّكَ عَطَاء غَيْرَ مَجْذُوذٍ﴾

දුර්භාග්‍ය වන්තයින් වන ඔවුන් නම් නිරයේ (ඇතුල් කර ඔවුන් එහි දෙනු ලබන වේදනාව විඳ දරා ගන්නට බැරිව) එහි (බූරුවෙකුගේ කෑ ගැසිල්ලක් මෙන්) මුලදී ඔවුන්ට එහි (දුක්) සුසුම් ලෑමත් (පසුව තම අවාසනා වන්තකම ගැන කණස්සල්ලෙන්) ඉකිබිඳීමත්ය. තවද ඔබගේ දෙවිඳුගේ මනාපය නොවන්නට අහස් සහ පොළොව පවතිනතාක් කල් ඔවුන් ඒ (නිරයෙ) හිම සදා පසු වනු ඇත. සැබැවින්ම ඔබගේ දෙවියා ඔහු සිතන දේ (කිසිදු බාධාවකින් තොරව කෂණිකව) කරන්නේය.

භාග්‍ය වන්තයින් වන මවුන් නම් ජන්නා (නම් උසස් ස්වර්ගයෙ) හි (ඇතුල් වන්නෝ) ය. ඔබ දෙවිඳුගේ මනාපය නොවන්නට අහස සහ පොළොව පවතින තාක් කල් ඔහු එහි (සදා සතුටෙන්) පසුවනු ඇත. එය අපරිච්චින්න අනුග්‍රහයක් (ලෙස සදා පවතින්නේය). (අල්කුර්ආන් 11 : 106-108)

තමාද සුවර්ගයට ඇතුල්වී එසේ භාග්‍ය වන්තයින් වන්නට නම් කුමක් කළ යුතු දැයි කෙනෙකු විමසුවා නම් එයට සර්ව ඥාන දෙවිඳු අල්ලාහ්ම තම පරිශුද්ධ අල්කුර්ආනය තුලින් මෙසේ පිළිවදන් දෙයි:

﴿فَمَنِ اتَّبَعَ هُدَايَ فَلا يَضِلُّ وَلا يَشْقَى، وَمَنْ أَعْرَضَ عَن ذِكْرِي فَإِنَّ لَهُ مَعِيشَةً ضَنكًا وَنَحْشُرُهُ يَوْمَ الْقِيَامَةِ أَعْمَى﴾

ඇත්තෙන්ම මාගෙන් ඔබට මගේ සුමග පැමිණ ඇත. මගේ යහමග පිළිපදින්නේ කවරෙක්ද ඔහු නොමග නොයන්නේය. දුර්භාග්‍ය වන්තයෙක්ද නොවන්නේය.
යමෙකු මගේ උපදේශය (වන යහමගෙ)න් වැළකෙන්නේද සැබැවින්ම ඔහුට පීඩා සහිත ජීවිතයක් වේ. තවද පරමාන්ත දිනයේ අන්ධයෙකු ලෙස අප ඔහු (නැගිටවා මහා විමසුම පිණිස) එක්රැස් කරමු.
(අල්කුර්ආන් 20 : 123-124)

තවද, යහකමෙහි නියැළෙන විශ්වාස වන්තයින් හට පුදන විශාල දීමනාව ගැන සර්වබල දෙවිඳු අල්ලාහ් පරිශුද්ධවූ අල්කුර්ආනයේ පැහැදිලිව මෙසේ විස්තර කරයි

﴿مَنْ عَمِلَ صَالِحًا مِّن ذَكَرٍ أَوْ أُنثَى وَهُوَ مُؤْمِنٌ فَلَنُحْيِيَنَّهُ حَيَاةً طَيِّبَةً وَلَنَجْزِيَنَّهُمْ أَجْرَهُم بِأَحْسَنِ مَا كَانُواْ يَعْمَلُونَ﴾

පුරුෂයෙකු හෝ ස්ත්‍රියෙකු හෝ යමෙකු ඔහු විශ්වාස වන්තයෙකු වී (සන්මාර්ගයට අධාල) යහකම් කරන්නේ නම් සැබැවින්ම අප ඔවුන්ට (සෞභාග්‍යවත්) සුවඳ වත් යහ දිවි පෙවෙතක් දෙන්නෙමු. තවද අප ඔවුන්ට ඔවුන් කරමින් හුන් දැයෙහි (එලොව) ඉතා හොඳ ඵලවිපාකද ලබා දෙමු. (අල්කුර්ආන් 16 : 97)

භාග්‍ය වන්තයෙකු හැකිතාක් අයුරෙන් අල්ලාහ් දෙවිඳුට කීකරු වී කටයුතු කළ යුතු අතර සියලු වන්දනාමාන පිරිසිදු චේථනාවෙන් අල්ලාහ්ට පමණක් කර ජීවත්වන කල ඔහු ඒ අයුරෙන්ම කිව නොහැකි සතුටක් ලබන්නේය. එසේම ඔහු අල්ලාහ්ට වන්දනාමානයන් සහ ඔහුගේ යුතුකම් ඉටුකිරීමෙහි කෙතරම් උදාසීනව කටයුතු කරන්නේද හෙතෙම ලබන සතුටද ඒ විලසින්ම අඩු වෙයි.

එහෙයින් සත්‍ය විශ්වාස වන්තයෙකුගේ සිත සැමවිටම සන්සුන්ව, සතුටින්, නිදහසින් ඔහුට කියා සම්පූර්ණව කීකරු වීමට යමෙකු ඇති බවත්, කිසිවක් නොගිළිහී මුළු විශ්වයම ඔහුගේ පාලනය යටතේ පසුවන බවත් මනාව වටහා ගෙන සිටී. වරෙක මුහම්මද් නබි තුමා මෙසේ පැවසූහ: 'දේව විශ්වාස වන්තයෙකුගේ සියලු කටයුතු ආශ්චර්යමත් අන්දමින් වෙ. ඔහුගේ සියලු කටයුත්තත් පින් ලෙස වන්නේය. එවැනි අවස්ථාවක් ඇත්තේ සත්‍ය විශ්වාස වන්තයෙකුට පමණි. ඔහුට සතුට ගෙන දෙන පුවතක් ලැබුණා නම් ඒ වෙනුවෙන් ඔහු අල්ලාහ් දෙවිඳුට හිතාන්තව ස්තුති වන්ත වෙයි. එය ඔහුට පිනක් ගෙන

දෙන්නේය. ඔහුට යම් නපුරක්, කරදරයක් වූ කල වෙනුවෙන් ඔහු ඉවසුමෙන් කටයුතු කරයි. එයද ඔහුට පිනක් ගෙන දෙන්නේය'. සෑම මොහොතකම නියම සතුටක් සිත් පිනවීමක් ලබා ගන්නට හැක්කේ මුහම්මද් නබි තුමාගේ මෙම කියමන අනුව ජීවිතය හැඩ ගස්වා ගැනීමෙන් පමණක් බව තරයේ වටහා ගත යුතුය.

### සතුට යනු කුමක්ද?

ඇත්තෙන්ම නියම සතුට යනු කිසිවෙකුට සිය නයනෙන් දැකිය නොහැකි දෙයකි, චින්තනයෙන් සිතෙන්, මැනිය නොහැකි පහසුවෙන් වටහා ගත නොහැකි දෙයකි, කිසි විටෙක මුදලෙන් තත්ත්වයෙන් මිලදී ගත නොහැකි දෙයකි.

සතුට යනු සිත් ප්‍රීතියෙන්, සිත් සන්සුනෙන් මිනිසා තම පංචේන්ද්‍රියයෙන් හැඟිය හැකි දෙයකි. සතුට මිනිසාගේ අභ්‍යන්තරයෙන් මිස සිටස්තරයෙන් ඇති වන දෙයක් හෝ ගලන්නක් හෝ නොවේ.

### සන්තෘෂ්ටිමත් කාන්තාව

සන්තෘෂ්ටිමත් කාන්තාවකගේ සිද්ධියක් පොතක මෙසේ සඳහන් වෙයි. වරෙක තම බිරිඳ හා සුළු කෝපයකට පත්වූ සැමියෙක් 'මා ඔබ දුර්භාග්‍ය වන්තයෙකු කරනවා' යනුවෙන් කෝපාවිෂ්ටව පවසා ඇත. ඔහුගේ කතාවට සාන්තදාන්තව ඇහුම්කන් දුන් ඔහුගේ බිරිඳ 'ඔබ මට භාග්‍යයක් දෙන්න බැරි වූවා සේ මාව දුර්භාග්‍ය වන්ත යෙකු ලෙසටද පත් කරන්නට ඔබට පුළුවන් කමක් නැත' යි පැවසුවේය. ඇගේ උත්තරයෙන් තවත් කෝපයට පත්වූ සැමියා ඔබ දුර්භාග්‍ය වන්තයෙකු කිරීමට හැකියාවක් නැතැයි ඔබ සිතනවාද? යි විමසුවේය. එයට ඇය ස්ථිර

ලෙස 'මට දෙන සතුට ඔබගේ පඩියෙන් නම් ඔබ මට වියදමට නොදී නවත්වනු ඇත. මා පළඳින ආභරණවල නම් ඒවා පළඳීමෙන් මා වළක්වනු ඇත. නමුදු සතුට ඔබගෙන් හෝ අන් කෙනෙකු විසින් හෝ ලබා දෙන්නට බැරි දෙයක් ලෙස තිබෙන කල ඔබ කෙසේ මා දුර් භාග්‍ය වන්තයෙකු කරන්නද?' යි ඇය උත්තර දුන්නාය. 'මා මගේ සතුට සහ භාග්‍යවන්තකම මගේ ශ්‍රධාවන්ත කමෙන් ලබා ගන්නවා. මගේ ශ්‍රධාවන්තකම පවතින්නේ මගේ සිතේ මිස අන් කිසි තැනක නොවේ. අන් කෙනෙකුගේ යටතෙහිද නොවෙයි, මගේ සිත මගේ කරුණාබර දෙවියා මිස අන් කිසි කෙනෙකුට භාරූ වන්නටත් බැරිය' යනුවෙන්ද පැවසුවාය.

## ලැබුනු දේ කෙරෙහි තෘප්තිමත් වීම

'අල්ලාහ්ගේ ස්වර්ගයේ වාසය කළා' නමින් ග්‍රන්ථය සැකසූ සුප්‍රසිද්ධ ගත් කරුවෙකු වන ආර්. එස්. බටලි තම ග්‍රන්ථයේ මෙසේ විස්තර කරයි. 'මම ජීවිතය කාලය තුල හැදැරූ ලොව ගැන මදක් දැක බලා ගැනීම පිණිස වර්ෂ 1918 දී පිටත්වුනෙමි. අප්‍රිකානු මහාද්වීපයේ තිරිත දිග රටවල්වල සමහර ගම්වලට ගිය අවස්ථාවේ එහි පිටිසර කාන්තාරවල ජීවත්වන සමහර අරාබි පරම්පරාවෙන් පැවත එන සමූහයන් සමග එක් වන්නට අවස්ථාවක් උදා විය. අවුරුදු හතක් පමණ කාලයක් ඔවුන් සමග වාසය කළෙමි. එහිදී ඔවුන්ගේ ස්වභාෂාව මැනවින් හදාරා ඒ භාෂාවේ මනා දැනුමක් ලබා ගත්තෙමි. ඔවුන්ගේ ඇඳුම් ඇඳ ගත්තෙමි. ඔවුන්ගෙන් කෙනෙකු මෙන් පිටිසර කාන්තාරවල නතා තිබුණු කූඩාරම්වල රෑ ගත කිරීමට පුරුදු වුනෙමි. ඔවුන්ගේ ආහාරය අනුභව කර ඔවුන්ගේ

පාරම්පරික වෘත්තිය වන එළුබැටළු පාලනය කරගෙන මවුන්ගෙන් කෙනෙකු මෙන් මගේ ජීවිතය ගත කළෙමි.

ඒ අවස්ථාවේ ඉස්ලාම් දහම ගැන මවුන්ගෙන් මනාව දැන ගත්තෙමි. එය දැනුම කොපමණ විශාල නම් වක්තෘ මුහම්මද් තුමා ගැන තරමක හොඳ ග්‍රන්ථයක් සකස් කරන්නට තරම් ඒ දැනුම ප්‍රමාණවත් විය. තවද මා ඒ ස්වදේශිකයන් සමග ජීවත්වූ වකවානුව අමතක කළ නොහැකි අත් දැකීමන් රාශියක් අත්පත් කර දෙන්නට සමත් විය. අඩු පහසුකම් වුවද සිත් ශාන්තිය සහ සතුට විඳින්නට තරම් ඒ දැනුම මට ඉවහල් විය'.

## සිත් චංචලය දමනය කිරීම

තවද ඔහු තම අත්දැකීම ගැන ඒ ග්‍රන්ථයේ මෙසේ විස්තර කරයි: ඕනෑම අවස්ථාවක සිත් චංචලය සහ නොසන්සුන දමනය කරන අයුරු ඒ පිටිසර අරාබි ජාතීන්ගෙන් මම මනාව වටහා ගත්තෙමි. මවුන් දහමෙන් මුස්ලිම්වරු පමණක් නොව, සර්වබල අල්ලාහ් දෙවිඳුගේ පෙරමිනුම සහ දෛවය කෙරෙහි ස්ථිර විශ්වාසයෙන් ජීවත්වූ අතර ඒ විශ්වාසය මවුන් සන්සුනේ ජීවත්වන්නට රුකුලක් බවටද පත් කරගෙන සිටියහ. එසේම ජීවිතය සැහැල්ලු දෙයක් බවට පිළිගන්නටද පරිවර්ථනය කර ගන්නටද ඒ විශ්වාසය මවුන් මනාව යොදා ගත්හ.

තවද මවුන් තම ජීවිත මංපෙත්තේ හමුවන සියලු සණයේ කාර්යයන් ගැන කිසිදු දුකක් හෝ සන්තාපයක් ලෙස හෝ නොපිළිගත්හ. වෙනුවට අල්ලාහ් දෙවිඳු විසින් කාහට කුමක් ලියා තිබේද එය අනිවාර්යයෙන්ම සිදුවනු ඇතැයි ස්ථිර විශ්වාසයකින් පසු වූහ. එහෙයින් යම්

අකරතැබ්බක් හෝ දුකක් හෝ ඇති වන්නේ නම්, එය අල්ලාහ් දෙවිඳුගේ පෙරමිනුම හෝ දෛවය මත සිදුවන කරුණක් බව ස්ථිර විශ්වාසයෙන් පිළි ගත්හ. මා මෙසේ පැවසුවද ඔවුන් දෙවිඳු අල්ලාහ්ගේ පෙරමිනුම පමණක් පිළිගෙන කිසිදෙයක් ස්වෝත්සාහයෙන් කටයුතු නොකළ සිටියා යැයි නොසිතන්න. මේවා මගේ සිතට තදින් කාවැදුණු ඔවුන්ගේ පැහැදිලි ජීවිතමගේ සමහර වැදගත් තොරතුරුය.

### දුක්කරදරවලදී ස්ථිරව සිටීම

දවසක්දා බලාපොරොත්තු නොවූ අන්දමින් භයානක සුළිසුළඟක් හමන්නට විය. තමා හා විශාල ප්‍රමාණයක සිහිඳු වැලිද ඔසවා ගෙන රශ්ණයෙන් හෙබි මහා කතාරෙන් පටන්ගත් ඒ මහා සුළිසුළඟ මධ්‍යදරණි මුහුදද වේගයෙන් පසු කර ප්‍රංශයේ රයින් ගඟ මිටියාවත සිසාරා ඒ වැලි අතුරන්නට විය. ඒ සුළිසුළඟ මගේ සණව වැඩී තිබුණු හිසකෙස් මුළින්ම උදුරා දමන්නට තරම් එකක් වූ අතර ඒ වේදනාව නිසා මා පිස්සෙකු බවට පත්වේදෝ යනුවෙන් සිතන්නට තරම් දරුණු එකක් විය. නමුදු ඒ පිටිසර අරාබි ජාතිකයන් ඒ ගැන එතරම් විශාල අන්දමින් නොතැකූහ. මන්දයත් කොපමණ වේගයෙන් සුළං හැමුවද පුරුදු පරිදි ඔවුන් තමන්ගේ පාඩුවේ තම කටයුත්තන් හී නිරත වන්නෝය.

එසේ දරුණු අත්දැකීම්වලට මුහුණ දෙන සියලු අවස්ථාවන්හීදීම ඔවුන් පුරුදු පරිදි සෘජුව තම උරහිස සොලවා 'මෙය ලියවී ඇති පෙරමිනුමක් දෛවයක්' යනුවෙන් සාමාන්‍යයෙන් පවසා කිසිම තැකීමකින් තොරව තම කටයුත්තන්හී නිරත වන්නාහ. එසේම

මෙවන් දරුණු සුළිසුළඟ නිසා තම ආහාරය වෙනුවෙන් ඇති කුඩා බැටළු පැටවුන් විනාශ වන්නට පෙර ඒවා කපා තම ආහාරය පිණිස යොදා ගනිතිග පසුව තමන් සතුව ඇති ඉතිරි බැටළුවන් ජල පහසුකම් ඇති මද සුළඟින් පෝෂණය වන දිසාවක් බලා යොමු කරති.

පසුව ඔවුන් තම දෛනික කටයුත්ත කිසිදු චින්ත කරදරයකින් තොරව ඒකිනෙකාට අවලාද නොකර පුරුදු පරිදි කර ගෙන යන්නට වග බලා ගනිති.

ඒ ගෝත්‍රය නියෝජනය කරන නායකයා පොදුවේ මෙසේ පැවසුවේය: මේ සුළඟෙන් අපට කිසිදු විශාල අලාභයක් හෝ හානියක් හෝ සිදු වී නැත වගයි. නිර්මාණයන් වන අප කවදා හෝ නැතිවන අයුරුල විනාශ වන අයුරු නිර්මාණය වී ඇති බව වටහා ගන්න. නමුදු සියලු ප්‍රශංසාවන් ස්තුතිය අයත් වන්නේ සර්වබල අල්ලාහ් දෙවිඳුට පමණි. තවද සුළඟෙන් පසු අපගේ බැටළු සම්පතෙන් සියයට හතළිහක් පමණ ඒවා ඉතිරි වී ඇතහ එයින් අපට හැකි අයුරෙන් උනන්දුවෙන් අපගේ ඉතිරි කටයුත්තත් හී යෙදෙන්නට පටන් ගත හැකිය.

## සතුටු කඳුළු

ඇමෙරිකානු එක්සත් ජනපදයේ ධනවත් කෙනෙකු සතුව විශාල වෙළඳ ව්‍යාපාරයන් කීපයක්ම විය. එහි එක් අංශයක මුස්ලිම් තරුණයෙකු සේවය කළේය. එහි අයිතිකරුවා තම ව්‍යාපාරය නැරඹීමට පැමිණෙන සෑම අවස්ථාවකම ඒ තරුණයාගේ මුහුණ සිනාමුසුව තිබෙණු ඔහු අවධානය කිරීමට අමතක කළේය. නමුදු අනෙක් සේවකයන්ගේ මුහුණු එසේ සෑම අවස්ථාවේම මදහසින්

පිරුණු එකක් බව හෙතෙම තුදුටුවේය. දවසක්දා සේවා ස්ථානයේ අයිතිකරුවා තම සේවාස්ථානය නැරඹීමට ගිය අවස්ථාවේ ඒ තරුණ මුස්ලිම් සේවකයා අමතා ඔහු සැම මොහොතකම සතුටෙන් පසුවන්නට හේතුව කුමක්දැ යි විමසුවේය. එයට මුල්ම හේතුව තමා මුස්ලිම් වරයෙක් බවත් අල්ලාහ් දෙවිඳුට බියවී කටයුතු කරන තම ශ්‍රධා වන්තකම තුලින් සතුටින් පසුවන බවත් උත්තර දුන්නේය. එසේ නම් තමාත් මුස්ලිම්වරයෙකු වූවා නම් සදා සතු ටෙන් සිටිය හැකිදැයි ඔහු බැගෑපත්ව විමසුවේය. සැබැවින්ම ඔව් යනුවෙන් පිළිතුරු දුන් තරුණයා පසුව තම සේවා ස්ථානයේ අයිතිකරුවා අසල නගරයේ පිහිටි ඉස්ලාමීය මද්‍යස්ථානයකට කැඳවා ගෙන ගියේය. ලැබුණු සැම අවස්ථාවකම ඉස්ලාමීය මධ්‍යස්ථානය වෙත ගිය ඔහු ඉස්ලාම් දහම ගැන පැහැදී නොබෝ දිනකින් සිත් සතුටෙන් ඉස්ලාම් දහම වැළඳ ගත්තේය.

ඉස්ලාම් දහම පිළිගත් ඔහු ඉකිබිඳිමින් හඬන්නට පටන් ගත්තේය. ඔහු අඬන්නට හේතුව ගැන විමසූ කල 'මා මගේ ජීවිත කාලයේ මුල්වරට සතුටක් තෘප්තියක් විඳපු දවස අදයි' යනුවෙන් ඔහු පිළිතුරු දුන්නේය. සිත් සතුට සහ එහි උසස්කම ගැන අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿ أَفَمَن شَرَحَ اللَّهُ صَدْرَهُ لِلإِسْلامِ فَهُوَ عَلَى نُورٍ مِّن رَّبِّهِ فَوَيْلٌ لِّلْقَاسِيَةِ قُلُوبُهُم مِّن ذِكْرِ اللَّهِ أُوْلَئِكَ فِي ضَلَالٍ مُبِينٍ﴾

'අල්ලාහ් යමෙකුගේ සිත ඉස්ලාම් දහම වෙනුවෙන් විස්ථාර කරන්නේද හෙතෙම තම දෙවිඳුගේ නොමද කාන්තියෙහි පසු වන්නේය. තවද අල්ලාහ් (ගේ සාධක

පිළිගෙන ඒවා) මෙනෙහි නොකිරීමෙහි කාගේ සිත් සණ වේදෝ මවුන්ට විනාශයකි. මෙවැන්නන් ප්‍රකට නොමගෙහි (පසු වන්නන්) ය'. (අල්කුර්ආන් 39 : 22)

සුප්‍රසිද්ධ ඉස්ලාමීය විද්වතෙකු වන ඉබ්නු කයියූම් ජව්සි තුමා සතුට ගැන මෙසේ විස්තර කරයි :

අල්ලාහ්ගේ අනපනත්වලට කීකරුව කටයුතු කරන අනවැසියෙකු සතුටෙන් පසුවනවාදැයි පහසුවෙන් උරගා බැලිය හැකිය. ඒවා ඔහු යම් අනුග්‍රහයක් ලැබූ විට ඒ වෙනු වෙන් අල්ලාහ්ට ස්තුති කරනු ඇත. ඔහු යම් පරීක්ෂයට භාජනය වූ කල ඒ වෙනුවෙන් ඉවසුමෙන් සන්සුනෙන් කටයුතු කරනු ඇත. ඔහු යම් පවක් කළා නම් ඒ වෙනුවෙන් සිත් කම්පා වී වහා පව් සමා අයදිනු ඇත.

මේ කරුණු තුන කෙනෙකුගේ සතුටට මුල්වන අතර, ඒ කරුණු තුන යමෙකු සතුව වේ නම් එය ඔහු එලොව සහ මෙලොව යන දෙලොවම ජය ගැනීමට වූ පෙර නිමිත්තකි. එසේ මේ තුන් කරුණ සත්‍ය විශ්වාස වන්තයෙකු කෙරෙහි සදා පවතින්නේය.

## අනුග්‍රහයන් වෙනුවෙන් ස්තුති වන්ත වීම

තවද අනවැසියෙකු අල්ලාහ් ඔහු වෙත පිරිනැමූ අනුග්‍රහය අඛණ්ඩව ලබන කල ඒ අනුග්‍රහයන් වටහාගෙන ඒ වෙනුවෙන් අති සතුටට පත් වන්නේය. අනුග්‍රහයන් පිණිස නිතර නිතර අල්ලාහ් දෙවිඳුට තුති පුද කරන්නේ සත්‍ය විශ්වාස වන්තයෙකු පමණි. ඒ හැර අන්කිසිවෙකු එහි නියම සතුට නොවිඳින්නේය. තවද කරුණාබර අල්ලාහ් දෙවිඳු අප මත හෙලූ අප්‍රමාණ අනුග්‍රහයන් හට

ඔහුට ස්තුති වන්ත වනවා නම් එය මතු සඳහන් කොන්දේසි පහක් මත වේ.

- ස්තුති වන්ත විය යුත්තා ස්තුතිය පිරිනැමිය යුතු දෙවිඳුට යටහත්පහත්ව කටයුතු කළ යුතුය.
- සෑම මොහොතකම අල්ලාහ් කෙරෙහි ප්‍රිය විය යුතුය.
- ලැබූ ඒ වරප්‍රසාධයන් සහ අනුග්‍රහයන් අල්ලාහ් වෙතින් ලැබුණු බව පිළි ගත යුතුය.
- ලැබූ අනුග්‍රහය වෙනුවෙන් අල්ලාහ්ට නොපමාව තුති පුද කළ යුතුය.
- අල්ලාහ් අකැමැති දේ මගින් ලබා ගත් අනුග්‍රහයන් භාවිතා නොකළ යුතුය.

එහෙයින් අප පෙර සඳහන් කළ කරුණු පහ අනුව කට යුතු කරන්නේ කවරෙක්ද හෙතෙම දෙලොව ප්‍රීතියම තමා සතු කර ගත් භාග්‍යවන්තයා වන්නේය. ඒවායෙන් එකක් හෝ කිරීමෙන් වළකින්නේ නම් හෙතෙම දුර්භාග්‍ය වන්තයෙකු වන්නේය.

## දුක් ඉවසීම

ඉවසුමෙන් කටයුතු කිරීම මතු සඳහන් කොන්දේසි මත විස්තර කළ හැකිය :

- අත්වන දුක්කරදරවලදී කෝපයට පත් නොවී ඒවා ඉවසුමෙන් දමනය කිරීම.
- තමාට ඇතිවූ දුක්කරදර සෑම කෙනෙකුටම දැනුම්

තොදී ඒවා පිටස්තරයන් අතර පැතිර වීමෙන් වැළකී සිටිය යුතුය.

- තමාට අත්වූ දුක්කරදර අවස්ථාවන්හී මුහුණේ ගසා ගනිමින් කොණ්ඩෙ සීසීකඩ කඩා දමා ගෙන ඇඳුම් ඉරාගෙන අනුන්ගේ විවේචනයට භාජනය වන අයුරු අඬා විලාප නොනගා ඉවසිල්ලෙන් කටයුතු කළ යුතුය.

අප ඉහත පෙන්වා දුන් තුන් ආකාරයට කෙනෙකු තම දුක්කරදර සහ ගැහැට හැකි අයුරෙන් දමනය කර ගැනීමට වග බලා යුතුව ඇත. යමෙකු තමාට අත්වන දුක්කරදර අවස්ථාවන්හී ඉවසීමෙන් කටයුතු කරන්නේ නම් ඔහුගේ ඒ දුක් කරදර ඔහුට අනුග්‍රහයක් ලෙසද, ඔහුගේ පරීක්ෂණයන් ඔහුට අත්වූනු වරප්‍රසාධයන් ලෙසටද වී, ඔහු අකැමැති දේ කැමැති දේ බවටද පරිවර්ථනය වන්නේය.

### පව් සමාව සහ පශ්චාත්තාපය

අල්ලාහ් දෙවිඳු තම කීකරු අනාවැසියෙකුට එලොව මෙලොව දෙලොව සතුටම පිරිනැමීමට බලාපො රොත්තු වන්නේ නම් ඔහු පව් සමා අයැදින්නටත් පශ්චාත්තාප වීමටත් අවස්ථාව ලබා දෙන්නේය. එසේම ඔහු කළ පාප යන් සිහිකර මා මේ මේ පාප කර්මයන් කළා යනු වෙන් එවා විස්තර කර තමා ඒවා ඉතා පහළ තත්ත්ව යක සිට කළ බවත්, ඒවායෙන් ඉවත් වන්නට ඔහු ගෙන්ම උදව් උපකාර පැතීමටත්, ඔහුගේ සියලු උවම නාවන් ඔහු මතම පැවරීමටත්, ඒ වෙනුවෙන් ඔහුගෙන්ම ප්‍රාර්ථනා පැතීමටත් අදහස් කරන්නේය. තවද සියලු කුසල් කර්මයන් කර ඒ මගින් ඔහු කෙරෙහි

ළඟාවීමට හෙතෙම අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් කැප වන කල අල්ලාහ් ඒ අනවැසියාගේ පව් සහ අනෙකුත් වැරැද්ද ඔහු වෙනුවෙන් වූ අනුග්‍රහයක් ලෙස පරිවර්ථනය කරන්නේය. එවිට අල්ලාහ් දෙවිඳුගේ පරම සතුරා වන ෂයිතාන් ඔහු ඒ වැරැද්දවල නැවතත් සම්බන්ධ නොවී සිටීම ගැන අතිශයින්ම දුකට පත් වන්නේය.

පව් කරන අනවැසියෙකු ස්වර්ගයට පිවිසෙන බවත්, කුසල් කර්මයන් කළ තැනැත්තා නිරයට යන බවත් අපගේ සමහර පැරැන්නන් පවසා ඇත්තේ මේ හේතුව නිසා විය හැකිය. එය කෙසේ වන්නදැයි ඔබ විශ්මයෙන් විමසිය හැකිය. අල්ලාහ්ගේ අනවැසියෙකු වැරැද්දෙහි බැඳේ. නමුදු වැරැද්ද කළ ඒ තැනැත්තා ඒ වෙනුවෙන් වූ අඬුවම අද පැමිණේදෝ හෙට පැමිණේදෝ යනුවෙන් බියවී සිත් වේදනාවට පත් වෙමින් ලැජ්ජාවෙන් පසු වන්නේය. ඔහු එසේ තමා කළ වැරැද්ද ගැන පසුතැවිලි වෙද්දී ඒ වරද සහ ඔහුගේ පසුතැවිල්ල ඔහුගේ දෙලොව ජය ග්‍රහණයට හේතු වන්නේය. තවද ඔහු කළ ඒ වැරැද්ද, පව් පින් සහ යහකම්වලට වඩා සතුටක් සෙවීම පිණිස ඔහුට බොහෝ අන්දමින් ප්‍රයෝජනවත් වන්නේය.

## අහංකාර කමේ විපාකය

තවද අනවැසියෙකු විවිධ යහකම්වල නියැළී පසුව ඒවා ඔහුගේ තක්සේරුව අනුව බොහෝ බව කල්පනා කර සමහරවිට මා එසේ කළා, මෙසේ කළා යනුවෙන් ආඩම්බරයෙන් සහ උඩඟුකමෙන් කියා පායි. ඔහු ඒවා ගැන කොපමණ දුරට පවසනාද කීවානම් එසේ කීමෙන් සමහරවිට ඔහුගේ යහකම් සියල්ල විනාශ වන්නට

හැකිය. එහෙයින් අල්ලාහ් දෙවිඳු තම අතවැසියෙකුට පිනක් තීරණය කළා නම් ඒ නිමිත් තෙත් මහු සමහර දුක්කරදරවලට භාජනය කර පරීක්ෂණයට භාජණය කර වතු ඇත. එය කොපමණ දුරට වේ නම් ඒ අතවැසියා තමා වෙතින් සරණ පැතීමටද, තමා අල්ප කෙනෙකු බවට පිළිගැනීමටද තරම් තත්ත්වයකට අල්ලාහ් මහු පත් කරන්නේය. එසේ නොවන්නට මහු කළ යහකම් නිසා මහු ආඩම්බරයට අහංකාරයට පත්ව විනාශ වන්නට තරම් ඒ යහකම් ප්‍රගුණ කර මහුට මවා පාන්නේය.

## භාග්‍යවන්තයින්

මතුලොවට පෙර මෙලොවෙහිම නියම සතුට ලබා ඒවායේ සුවය විඳින්නන් කෙසේ පසුවනවාද? මහුන්ගේ කතා, ක්‍රියාවන් සහ මහුන්ගේ අනෙකුත් කටයුතු තුලින් මවුන් කුමණ තත්ත්වය පසුවනවාදැයි මදක් සිතා බැලිය යුතුය.

එහෙයින් භාග්‍යවන්තයින් අල්ලාහ් දෙවිඳුට කීකරු වී, පිරිසිදු චේතනාවෙන් අල්ලාහ්ගේ ආඥාවන් නිසිලෙස ඉටු කර, කිසිදු ආදේශ කිරීමකින් හෝ වෙනස් කිරීමකින් තොරව, මහුට පමණක් යහ කර්මයන් කර, සුජූද් සහ රුකූඋ වැනි වන්දනාමානයන් නියම ලෙස ඉටුකර, උප වාස ශීලයෙහි යෙදී, මහු අනුමත කළ දේ පමණක් කර, මහු විසින් තහනම් කළ දේ වෙතින් සම්පූර්ණයෙන්ම ඉවත්වී සම්පූර්ණයෙන්ම මහුට පමණක් යටත්වී කටයුතු කරතු ඇත. එසේ කිරීමෙන් විනා අන් කිසිදු ආකාර යකින් සතුටු විය නොහැකි බව වටහා ගත යුතුය.

එහෙයින් කෙනෙකුගේ නියම සතුට තම මැවුම් කරුවා වන අල්ලාහ් දෙවිඳුට පමණක් කීකරු වී යට

හත් පසහත්ව වන්දනාමාන කිරීමෙන් ලබාගන්නා අතර, තම දෙවිඳු විසින් පෙරමිනුමක් ලෙස තීරණය කර ඇති දෛවය පිළිගනිමින් ඒවා නොවරදවා එලෙසම සිදුවනු ඇතැයි සිත්සතුටෙන් පිළි ගැනීමෙහිද පිහිටා ඇත.

## දුකට සහ සිත් වේදනාවට පිළියම

කෙනෙකුට ඇතිවන කරදර, සිත් වේදනාව සහ කණස්සල්ල වැන්න මහු වෙතින් කෙසේ තුරන් කර ඒවා සතුටට හරවා ගත යුතුද යන්න වක්තෘ මුහම්මද් තුමා පෙන්වා දී ඇත. යමෙකුට එසේ සිත් වේදනාවක් සහ කණස්සල්ලක් ඇතිවූ විට මෙසේ ප්‍රාර්ථනා කළ යුතු බව මුහම්මද් නබි තුමා දෙසූහ : 'අල්ලාහුම්ම ඉන්නී අබ්දුක, ඉබ්නු අබ්දික, වඉබ්නු අමතික. නාසියතී බියදික. මාළින් ෆී හුක්මික. උද්ලුන් ෆීය කළාඋක. සම්මයිත බිහී නෆ්සික. අව් අන්සල්තහූ ෆී කිතාබික. එව් අල්ලම්තහූ අහදන් මින් කල්කික. අව් ඉස්තඃසර්ත බිහී ෆී ඉල්මිල් ගයිබි ඉන්දික. අන් තජ්අලල් කුර්ආනල් අළීම් රබීඅ කල්බී. වනූර සද්රි, වජ්ලාව හුස්නී, වදහාබ හම්මී' (තේරුම : මාගේ දෙවියනි, සැබැවින්ම මම ඔබගේ වහලා වෙමි. ඔබගේ වහලුන්ගේ සහ වහලියන්ගේ ළමයා වෙමි. අපගේ පෙර නළලේ කෙසග ඔබ අතේය. ඔබගේ පාලනය අප මත වේ. අප කෙරෙහි වූ ඔබගේ තීන්දුව යුක්ති සහගතය. ඔබ, ඔබ වෙනුවෙන් තබා ගත් නාමයන්, ඔබ, ඔබගේ ග්‍රන්ථයේ පහළ කළ නාමයන්, ඔබගේ නිර්මාණයන්ගෙන් කෙනෙකුට ඔබ ඉගැන්වූ නාමයන්, ඔබගේ අදෘශ්‍යමාන ඥානයෙන් ඔබ තෝරා ගත් නාමයන් වන ඔබගේ සියලු නාමයන්ගෙන් ඔබගෙන් අයැදිමු. උසස් පුණ්‍ය කුර්ආනය මගේ සිතට වසන්තයක් ලෙසද, ආලෝකයක් ලෙසද, මගේ

දුක් කරදරයන් ඉවත් කරන්නක් ලෙසද කරනු මැනව) යනුවෙන් පවසන කළ අල්ලාහ් දෙව්දූ ඔහුගේ සියලු දුක්කරදර සහ කණසසල්ලන් ඔහු කෙරෙන් තුරන් කර ඒ වෙනුවට ඔහුට සිත් සතුටක් සහ ශාන්තියක් ලබා දෙන්නේය. (මූලාශ්‍රය : අහ්මද්)

## දුර්භාග්‍යට හේතු

විද්වතෙකු වන ඉමාම් ඉබ්නුල් කයියුම් තුමා මෙසේ විස්තර කරයි : 'දහම අනුමත නොකළ දේ ගැන සුදුසුද නැද්ද යනුවෙන් ආගම් දෘෂ්ටියෙන් බලන්නේ කවරෙක්ද, ඔවුන් එහි යහපත සහ අයහපත දැනගෙන, මැනගෙන එයින් තමන් ආරක්ෂා කරගනු ඇත.

- දුදනෙහි අවසාන විසඳුම සහ විපාකය නොදැන පසුවන්නේ කවරෙක්ද, ඔහු පරිශ්‍රමයෙන් සතුට ලබා ගන්නට උත්සාහ කරන විට එය ඔහුට කරදරයක් සහ කණස්සල්ලක් ගෙන දෙන අතර ඔහු කුමක් මගින් සතුටක් බලාපොරොත්තු වන්නේද එය ඔහුට තවතවත් දුක්කරදර ලබා දීමට හැකිය.

- නමුදු තමා කළ වැරදි ගැන පසුව සිතට වහල් නොවී මධ්‍යස්ථව නිදහසේ කල්පනා කර බලනවිට ඔහු පෙර කළ දේ මනාව පැහැදිලි වනු ඇත. ඔබ අල්ලාහ් දෙව්දූට අනපනත්වලට කීකරු වන්නට ඇත. නොවන් නට ඔහුගේ ආඥාවන් නොසැළිකිලමත්ව අතපසු කර දමන්නට ඇත. ඔබ අල්ලාහ්ගේ ආඥාවන් හට පිටුපා ඇත්නම් ඔහුගේ සතුට ඔබට ලැබීමට ඇති අවස්ථා වන් අහිමි වන්නේය. ඒ වෙනුවට ඔබ කළ පරිශ්‍රමය නිසා ඔබ විඩාවට පත්වූ ප්‍රමාණය අප්‍රමාණය. දැන්

ඒවා සියල්ල ඔබගෙන් ඉවත් වී ගොස්ය. එහෙයින් දුදනෙහි නිතර නොවී සිටියානම් ඒවා ඔබට අහිතක් ඇති කරන්නේ නැහැනේද?

මේ කරුණ ගැන තවත් විස්තර කර කියනවා නම් ඔබ මෙලොවෙන් සමුගන්නා ඔබගේ මරණ මොහොත ගැන මදක් සිතා බලන්න. ඔබ ජීවත්වන කල නොසැළකිල් ලෙන් පසුවී ඔබ අනිවාර්යෙන් ගෙවා දැමූ කල කාලය ගැන මදක් සිතා බැලිය යුතුව ඇත. ලෞකික ආශාවන් සහ සතුට ඔබ කෙසේ ජය ගන්නවාදැයි කීමට මා බලා පොරොත්තු වන්නේ නැත. මන්දයත් ඒ සතුට සහ මිහිර සමහරවිට තිත්ත බවට පත්ව ඒවාට මුහුණ දීමට අපහසු වී ඒවා ඔබට විශාල හිරිහැරයක් වන්නට හැකිය.

තවද යමෙකුගේ සියලු කටයුත්තන්හී විපාකය එහි අවසානය මත තීරණය කරන බව ඔබ වටහාගත යුතුය. එහෙයින් සිතට වහල් නොවී දුක්වන්නට පෙර එවැනි සුළු සුළු ආශාවන් සම්පූර්ණයෙන්ම දමනය කර, ඔබගේ අවසාන මොහොත ගැන මදක් කල්පනා කර යහමින් කටයුතු කර, සතුට තම සේසත් කර ගත් කෙනෙකු ලෙස මරණයට පත් වන්නට අධිෂ්ටාන කර ගත යුතුය.

## භාග්‍යවන්තයින් හට වදනක්

ප්‍රබල ඉස්ලාමීය විද්වතෙකු වන හසන් අල් බසරි තුමා මෙසේ විස්තර කරයි : 'ඔබලා නියම සතුට ගෙන දිය හැකි නැමදුම, අල්ලාහ්ගේ දික්ර් සහ කුර්ආනය පාරායනය කිරීම යන තුන් කාරණයන්හී නිරත වෙමින් ලබාගත යුතුය. එසේ ලබා ගැනීමට ඔබලා අපොහොසත්

වන්නේ නම් ඔබට සන්තෘෂ්ටියේ දොරටු සම්පූර්ණයෙන්ම අගුලු දමා ඇති බව තරයේ සිතේ තබා ගන්න'.

## නියම සතුට

තවත් විද්වතෙකු වන මාලික් බින් දීනාර් තුමා මෙසේ පවසයි: 'සතුට රස වින්ද අය දෙවිඳු අල්ලාහ් දික්ර් සහ ධ්‍යානය කිරීමෙන් සතුටට පත් වන සේ කිසිවිටෙක අන් මාර්ගයකින් සතුටට පත් නොවන්නේය.

තවත් සමහරු සතුට ගැන පවසන කල 'අනිවාර්තේ නුවුවමනා කටයුත්තන්හී නම වටිනා කාලය ගෙවන වාට වඩා රෑ නැමදුමෙහි යෙදෙන්නන් හට එහි සතුටක් වෙ. රෑයත් නොවන්නට මා මෙලොවෙහි ජීවත් වීමටද කිසිදු කැමැත්තක් නොදක්වමි' යි විස්තර කරති. 'පුරා අවුරුද්දක රෑ නැමදුමෙහි නිරතව සිටියෙමි. ඒ මගින් අවුරුදු විස්සක හා සමාන සතුටක් භුක්ති වින්දෙමි' යනුවෙන් කෙනෙකු පැවසුවේය.

සමහරෙක් මෙසේ විස්තර කරති: 'රෑ අවසන් වී අළුයම වීම මිස අන් කිසිවක් මා දුකට පත් කරන්නේ නැත'.

තවත් සුප්‍රසිද්ධ ඉස්ලාමීය චින්තන වාදියෙකු වන ඉබ්රාහීම් බින් අද්හම් තුමා පවසන කල 'අප භුක්ති විඳින සතුට සහ සන්සුන රජවරුන් සහ මහුන්ගේ රජදරුවන් වටහා ගන්නේ නම් ඔවුන් ඒවා ලබා ගන්නට අසිපත රෑගෙන අප සමග සටනට පැමිණෙනු ඇත' යනුයෙන් පැවසුවේය.

තවත් ප්‍රධාන පෙලේ ඉස්ලාමීය විද්වතෙකු පවසන කල 'මා දවසේ සමහර වේලාවන් ගෙවමින් පසුවන

කල, ස්වර්ග වැසියන් මෙසේ පසුවනවා නම් මවුන් යහමින් තම ජීවිතය ගත කරමින් පසුවනු ඇත' යනු වෙන් පැවසුවේය.

## මිහිපිට ස්වර්ගය

ඉබ්නුල් කයියූම් ජව්සි තුමා වරෙක කළ විස්තරය ඉමාම් ඉබ්නු තයිමියා තුමා මෙසේ විස්තර කරයි: මිහිපිට ස්වර්ගයක් වේ. එහි පිවිසීමට අවස්ථාවක් නොලැබුණේ කාටද ඔහු මතුලොවේ ස්වර්ගයට නොපිවිසෙන්නේය.

තවද වරෙක එතුමා මා සමග පවසන කල, මගේ සතුරන් මට කිනම් නපුරක් කරන්නටද? මන්දයත් මගේ ස්වර්ගය සහ සතුටු උද්‍යානය මා තුලම වන බැවිනි. මා එහි තුල වූ කල එය මා වෙතින් ඉවත් නොවී මා සමගම පසු වෙයි. තවද මා වළකන්නේ මගේ තනිකම වේ. මා ඝාතනය කරන ලද්දේ නම් එය මට වීර මරණයක් බවට පත් වන්නේය. මා ගමෙන් පිටමං කරන ලද්දේ නම් එය මට සංචාරයක් වේ.

වරෙක කල්අා නම් ගම්මානයේ පිහිටි හිර ගෙදරක ඉබ්නු තයිමියා තුමා හිර කරන ලදී. එතුමා එසේ හිර කර සිටි අවස්ථාවේ 'කල්අා ගම්මානය සම්පූර්ණයෙන්ම රනින් පිරී, මා ඒවා සියල්ල මගේ මනාපය පරිදි වියදම් කළද, මවුන් මා මෙහි සිරකර තබන අවස්ථාවේ යහකම් කරන්නට මා ලබා ඇති අවස්ථාව හා සමාන නොවන්නේය' යනුවෙන් විස්තර කළේය.

තවත් වරෙක එතුමා 'හිර කිරීම හෝ තහනම් කිරීම යනු තම සිත්සේ තම දෙවිඳු වන්දනාමාන, ද්‍යාන කළ

නොහැකි අන්දමින් ඔහුන්ගේ හිත හිර කිරීම වේ' යනුවෙන් විස්තර කළේය. යමෙකුගේ එහි අයිතිකරුවා එයට සම්පූර්ණයෙන්ම වහල් කර ගන්නේද වහල් කම යනු එය වේ'. වරෙක එතුමා කල්ආ ගම්මානයට ගොස් එහි ඇති හිරගෙවල්වල බිත්ති දෙස බලා ගෙන මතු සඳහන් පරිශුද්ධවූ අල්කුර්ආන් වැකිය පාරායනය කළේය.

﴿فَضُرِبَ بَيْنَهُم بِسُورٍ لَّهُ بَابٌ بَاطِنُهُ فِيهِ الرَّحْمَةُ وَظَاهِرُهُ مِن قِبَلِهِ الْعَذَابُ﴾

'පසුව ඔවුන් අතර බිත්තියක් දමනු ලබනු ලබන්නේය. එයට දොරටුවක්ද වේ (විශ්වාස වන්තයින් පසුවන) එහි ඇතුළත (දෙවිඳුගේ) අනුග්‍රහයකි එහි බැහැර (සෑම පැත්තකින්ම) දැඩි වේදනාවක් වේ' (57 : 13)

### වක්තෘත්වයේ කාන්තිය

මුහම්මද් නබි තුමා දෙසූ බව අනස් බින් මාලික් තුමා මෙසේ විස්තර කරයි : මතුලොව ගැන විශේෂ ඇල්මක් දක්වන්නේ කවරෙක්ද, ලද දෙයින් තෘප්ති මත් වීමේ හැඟීමක් අල්ලාහ් ඔහුගේ සිත් තුල ඇති කර වන්නේය. එසේම ඔහුගේ සිත සහ චින්තනය නොවිසිරී යන අයුරින් එක්කර, ඔහු ලෞකික සතුට පිළිකුල් කළද, ඒවා ඔහුගේ පාමුලට පැමිණෙන්නට සළස් වන්නේය. නවද ලෞකික ජීවිතය ඉලක්කය කොට ගෙන කටයුතු කරන්නේ කව රෙක්ද ඔහුට අඩුලුහුඩුවෙන් වූ පීඩාවෙන් පිරුණු ජීවිත යක් සළස්වා ඔහුගේ සිත සහ චින්තනයන් විසුරුවා හැර අල්ලාහ් ඔහුට කුමක් ලියා තිබේද එය පමණක්

ලබා ගැනීමට සළස් වන්නේය. (මූලාශ්‍රය : බුහාරි)

මුහම්මද් නබි තුමාගේ තවත් දෙසුමක් මෙසේ වේ: 'තවද, තම ස්ථානයේ ශාන්තියෙන් සුවෙන් සහ තමාට එදින වූ යැපීම් ලබා ගන්නේ කවරෙක්ද, හෙතෙම ලොවේ තමාට නියම වී ඇති සම්පත් තම හස්තයට හසු කර ගත් තැනැත්තා වන්නේය'.
(මූලාශ්‍රය : බුහාරි සහ ආදාබුල් මුෆ්රද් - තිර්මිදි)

මුහම්මද් නබි තුමාගේ තවත් දෙසුමක් මෙසේ වේ: 'ඔබලා ඔබලාට ඉහළින් වැජඹෙන අය දෙස නොබලනු. නමුදු ඔබට වඩා පහළින් පසුවන්නන් දෙස පමණක් බලනු. ඇත්තෙන්ම දෙවිඳු ඔබ වෙත දී ඇති අනුග්‍රහ යන් කෙරෙහි තුච්ච ලෙස සැළකීමෙන් වැළකීමට මෙය අති සුදුසු අවස්ථාවකි'. (මූලාශ්‍රය : බුහාරි)

හිතවතුනි, සැබැවින්ම නියම සතුට අප ලබා ඇති දේ කෙරෙහි තෘප්තිමත් වීමෙහි සහ ඒවා කෙරෙහි ප්‍රමාණ වත්ය යන සිත් සතුටෙහිද, විශ්වයේ නිර්මාතෘවරයා වන අල්ලාහ් දෙවිඳුට කීකරු වී වන්දනාමාන කිරීමෙහිද, ඔහු හැර අන් ඒවාට යටත් වී කටයුතු කිරීමෙන් වැළකී සිටීමෙහිද රැඳී පවතින්නේය.

## සමෘධිමත් මග

ඇත්තෙන්ම සමෘධියට එක් මගක්ද දුර්භාග්‍යයට තවත් මං කීපයක්ද අප ඉදිරියෙහි වැටී ඇත. නියම බුද්ධිමතා කවරෙකු වේ නම් තමා සෞභාග්‍යමත් ජීවිතය වෙත

යොමු කරන මග වටහා ගෙන ඒ ඔස්සේ ස්ථිරව ගමන් කරන්නා වේ. බොහෝ දෙනෙකු ඒ මග නියම ලෙස වටහා ගන්නට බැරිව තම සිතට වහල්වී අත්තනෝමතික ලෙස කටයුතු කර තම ජීවිතය අඳුරු පටලයකට ඇද ගෙන යනු අප අනන්ත අප්‍රමාණව දැක ඇත්තෙමු.

විශාරද ඉබ්නුල් කයියුම් ජවසි තුමා මෙසේ විස්තර කරයි: 'අප දැනගත යුතු වැදගත් කාරණයක් වේ. සැම සතෙක්ම තමා නියම වී අති සන්තෘෂ්ටිමත් ජීවිතය ලබා ගෙන ඇත යන්න සැම කෙනෙකුම වටහා ගත යුතුව ඇත. එසේ තම නියම සෘජු මාර්ගය සොයා ගැනීමට නම් කරුණු කීපයක් ගැන මදක් කල්පනා කර බැලිය යුතුව ඇත. ඒවා මෙසේය :

- අනවැසියෙකුට ප්‍රයෝජනවත් වී, සිත් සතුට, ප්‍රීතිය සහ සන්සුන ලබා දිය හැකි දේ ගැන මනා වැටහීමක් තිබිය යුතුය.
- එසේ තමාට ප්‍රයෝජනවත් දේ වෙත යා හැකි සෘජු මාවත ගැන දැනුමක් ලබා සිටිය යුතුය.
- ඒ සෘජු මාර්ගය ඔස්සේ ගමන් කිරීමට කටයුතු සැළැස්විය යුතුය.
- ඔහුගේ ජීවිතය නිහීන කළ හැකි සියලු බාධක ගැන මනාව අවබෝධ කර ගත යුතුය.
- එවැනි නිහීන කටයුතුවලට ඇදගෙන යා හැකි මාවත ගැන මනා අවබෝධයක් ලබාගත යුතුය.
- එසේ වටහා ගෙන ඒ වැරදි මාර්ගය ඔස්සේ යැමෙන්

වැළකී සිටිය යුතුය.

එහෙයින් අප පෙර සඳහන් කළ ඒ කරුණු ගැන මනා දැනුමක් ලබා ගත් කල, කෙනෙකුගේ ජීවිතයේ සතුට සහ සන්සුන ඉතා පහසුවෙන් ලබා ගත හැකි වන්නේය. වෙනුවට ඒ කරුණුවලින් එකක් හෝ ඌන වූ කල, ඔහුගේ ජීවිතයේද ඌනයක්, අඩුවක් ඇති වී දුර්භාග්‍ය තත්ත්වයකට පත් වන්නේය.

## සම්පූර්ණ සතුට

යමකු සම්පූර්ණ සතුටක්, සෞභාග්‍යමත් ප්‍රීතියෙන් සපිරුණු ජීවිතයක් ලබා ගැනීමට නම්, තම නිර්මාතෘ වරයා වන අල්ලාහ් දෙවිඳු මනාව හඳුනා ගෙන ඔහු පමණක් වන්දනාමානයට තෝරා පත් කර ගෙන කට යුතු කිරීමට උත්සාහ දරන්නේ නම් ඔහු සදා සතුටෙන් පිරුණු ඒ සෞභාග්‍යමත් ජීවිතය පහසුවෙන් තමා සතු කර ගන්නේය. වෙනුවට යමෙකුගේ සිත සහ චින්ත නයන් අරමුණකින් තොරව අප්‍රයෝජනවත්ව අනෙකුත් මග ඔස්සේ විසිරී යන්නේ නම් ඔහුගේ මනස ස්ථිර චින්තනයකින් තොරව සුදුසු කේන්ද්‍රස්ථානයක් නොවී මංමුලාවීමට හැකිය. එසේ ස්ථිර පිළිමයකින් චින්තන යකින් තොරව මං මුලාවන්නා අවසානයේ නිහීන පහත් ජීවිතයකට ඇද ගෙන වැටෙන්නේය.

## අල්ලාහ් කෙරෙහි ප්‍රිය වීම

උසස් සිත් සතුටෙන් පිරුණු ප්‍රයෝජනවත්, සන්සුන්, නෙත් පිණවන ජීවිතයක් ලබා ගත හැකි වන්නේ කරුණාබර දෙවිඳු අල්ලාහ් වෙතින් පමණී. නමුදු තමා

ලෞකිකව ප්‍රියවන සෑම දේ කෙරෙහි සිත යොමු කරන විට ඒ සතුට ශාන්තිය සහ සන්සුන කිසිවිටෙක ලබා ගන්නට හැකි නොවන්නේය.

**මවදන සහ සුභාශිංසනය**

සහෝදරයිනි,

ඔබගේ ඉලක්කය සර්වබල දෙවිඳු අල්ලාහ්ට කීකරු වී සියලු වන්දනාමානයන් සහ යහකර්මයන් පිරිසිදු චේතනාවෙන් ඔහු වෙනුවෙන් පමණක් කිරීමෙහි විය යුතුය. එසේ අධිෂ්ඨානයකින් කටයුතු කිරීම අනිවැසියෙකු උසස් සන්තෘෂ්ටියක් භුක්ති විඳීමට අවසථාව උදා කරන්නේය. එසේ තම ජීවිතය සකස් කර ගන්නා පරමාන්තයේ තම ස්ථිර නිවහන ස්වර්ගයේ කර දෙන්නේය. එසේ කටයුතු කිරීමෙන් ස්වර්ග වැසියන් එහි ලබනවා හා සමාන සතුටක් හෙතෙම මෙලොවෙහිද ලබා ගන්නේය.

නමුත් ස්වර්ගයේ සතුටට සහ සැපට සමාන කිසිදු සතුටක් සහ සැපතක් මිහිපිට කිසිදාක නැති බව ස්ථිරසාරව වටහා ගත යුතුය. ඒ ගැන සුභාශිංසනය කරමින් මුහම්මද් නබි තුමා මෙසේ දෙසූහ: 'මෙලොවේ කාන්තාවන් සහ සුවඳ විලවුන් මා ඉතා ප්‍රිය වන දේවල් වේ. නමුදු මගේ නෙත් පිණාවීම ඇත්තේ අල්ලාහ් වෙනුවෙන් නැමදුම් කිරීමෙහිය'. (මූලාශ්‍රය: අහ්මද් සහ නසඉ)

නෙත් පිනවීම මිහිපිට ඇති සියල සතුටන්ගෙන් උසස් තත්ත්වයෙහි පවතින්නේය. එහෙයින් අනුමත දෙවලින් කැමැති උසස් දේ කෙරෙහි නෙත් පිනවිය හැකි සතුට

රැඳී පවතින්නේය. එසේ උසස් යැයි පවසන්නට අල්ලාහ් දෙවිඳු හැර අන් කිසිවෙකු මිහිපිට නැත. කෙනෙකු ඔහු හැර ප්‍රිය විය හැකි අන් සියලු දේ ඇත්තේ ඔහුට පසු වෙයි. එහෙයින් ඒවා කෙරෙහි ප්‍රියවනවා නම් ඒවා අල්ලාහ් දෙවිඳු සමග යා කර ප්‍රිය නොවී ඔහු වෙනුවෙන් පමණක් ඒවා ප්‍රිය වන බව අදහස් කර ගත යුතුය. මන්දයත් ඔහු සමග යා කර අන් ඒවා ප්‍රිය වන කල, එය අල්ලාහ් දෙවිඳුට ආදේශ කිරීමක් වන හෙයිනි. ඔහු වෙනුවෙන් ඒවා ප්‍රිය වන කල එය අල්ලාහ්ගේ තව්හීද් නම් ඒකීයත්වය නියෝජනය කරන බවක් ලෙස අදහස් වෙයි.

ඥානයෙන් සෞභාග්‍ය

සිතේ බලපෑමක් ඇති කිරීමට හැකි සෞභාග්‍යය ගැන ප්‍රබල ඉස්ලාමීය විද්වතෙකු වන ඉබ්නුල් කයියුම් ජව්සි තුමා මෙසේ විස්තර කරයි :

1. ලෞකික සේසත් සහ පවුල් ජීවිතය වැනි දේ මිනිසා හා සම්බන්ධ වී ඇති බාහිර සතුටන්ය. ඒවා මනාව ලබා ගෙන මිනිසා සතුටෙන් සන්සුනෙන්, පසුවුවද දවසක්දා ඒවා සියල්ල ඔහුගෙන් ඉවත් වී ඔහු ඉතා නිහීන තත්ත්වයකට පත්ව කිසිදු සැළකිල්ලක් නැතිව අසරණ වන්නේය. එසේම ඒවා නියෝජනය වන්නේ ලෞකික සේසත් මගින් සුළු කලකට පමණක් ඇති විය හැකි කාල්පනික ප්‍රයෝජන හෝ ගෘහස්ත සතුන් වැනි දේ මගින් ලබන ඵල හා සම්බන්ධ ඒවා වන්නේය. යමෙකු කාල්පනික ප්‍රයෝජන සහ ගෘහස්ථ සතුන්ගෙන් ඇති වන ප්‍රයෝජන මගින් උපයන සේසත් කාල්පනික ව්‍යාජ පුහුමානයෙන් යුත් සේසතක් ලෙස වන්නේය. එසේ

ලැබෙන සේසත පුහුමානයෙන් ඉදිමී තම සිත්සේ වියදම් කරන විට එය හුදෙක් කාල්පණික පුහුමානයෙන් පිරුණු ව්‍යාජ සතුටක් වන්නේය. එසේම සේසතකින්, ධනයකින්, වස්තුලින් ලැබෙන නව ක්ෂණික සතුට තාවකාලික සතුටක් මිස එය සදහටම රඳා පවතින සතුටක් නොවන් නේය. මන්දයත් එසේ සේසතෙන් ලැබුණු සතුට බුක්ති විඳින විට එහි තත්ත්වය අඩුවැඩි වෙමින් හෝ එන්න එන්නම අඩුවෙමින්ද පවතිය හැකිය. සමහර විට යතා කාලයේදී ඒ සතුට සදහටම නැතිවී යැමටද හැකිය.

2. ශරීරයේ අවයවයන් ආශ්‍රිත දේහ ලක්ෂණ සහ ශරීර සෞඛ්‍ය හා සම්බන්ධ කරුණකි. යමෙකුගේ ශරීර සෞඛ්‍ය ස්ථිරව යහ තත්ත්වයකින් පසු වේ නම්, ඔහුගේ සිත, නිරෝගී සෞඛ්‍ය තත්ත්වය සහ ශරීර ශක්තිය මත ඔහුගේ චින්තනය සහ යහමින් ක්‍රියාවීමට ඔහු ලබා ඇති බාහිර සතුට පවා ඔහු සමග සදා පවතිය නොහැකි තාවකාලික සතුටක් වන්නේය. මන්දයත් මිනිසා තමා ලබා ඇති සජීවී ජීවන බලයෙන් සහ උසස් චින්තනයෙන් මිනිසෙක් බවට තක්සේරු වනවා මිස හුදෙක් ඔහුගේ දේහයේ පුෂ්ටියෙන්, ශක්තියෙන් සහ සෞඛ්‍ය තත්ත්වයෙන් පමණක් නොවන්නේය. එහෙයින් මිනිසා තමා ලබා ඇති දේහ ලක්ෂණය සහ ශක්තිමත් සෞඛ්‍ය තත්ත්වය මගින් සතුටට පත් වූවද, ඒ සතුට පවා ඔහුගේ බාහිර පෙනුමෙන් වූ සතුටක් විනා සදා ඔහු මත රැඳී පවති හැකි නිරන්තර සතුටක් නොවන්නේය.

ඇත්තෙන්ම නිත්‍ය සතුට, මනස සහ චින්තනාශ්‍රයෙන් වූ ජීවය හා සම්බන්ධ සතුටක් වේ. ඒ සතුට ලබා ගත හැක්කේ ප්‍රයෝජනවත් ඥානයක් සහ අනුමත වූ ක්‍රියාවන්ගෙන් පමණි. මන්දයත් මිනිසාගේ තත්ත්වයන් සහ අවස්ථාවන් වෙනස් වන මොහොතක් මොහොතක් පාසාම ඒ සතුටද අඩුවැඩිවෙමින් වෙනස් වන්නේය. එසේම මිනිසා ගමන් කරනා ලෞකික කටයුතු මාර්ගය, හෙතෙම ඒ වෙනුවෙන් ක්‍රියා කරන ආකාරය, ඔහුගේ මරණෙන් මතු මිනිවලේ ජීවිතය සහ මතු ලොව ජීවිතය වැනි සියල්ලෙහි ඒ සතුට සම්මිශ්‍ර වී ඔහුට පිටිවහල් වෙමින් ක්‍රියා කරන්නේය. එසේ ක්‍රියා කිරීමෙන් ඔහු අදියරෙන් අදියර අවස්ථාවෙන් අවස්ථාව සතුටේ සම්පූර්ණ අද්විතීය උසස් තත්ත්වයකට පත් වන්නේය.

නිර්මාණයන්ගේ අනුවණකම

ජීවිතයේ නියම සතුටට ඇතුල් වීමට ප්‍රමුඛ දොරටුව අප ඉහතින් සඳහන් කළ කරුණු අනුව නිහතමානීව ක්‍රියා කිරීම වේ. අපගෙන් බොහෝ දෙනෙකු ඒ මනා කරුණු පිළිගැනීමට මැලිවෙමින් ප්‍රතික්ෂේප කරන්නේ මක්නිසාදැ යි මදක් විමසා බැලීම අවස්ථාවෝචිතය. එයට සුදුසු පිළිතුරක්ද නැත්තා නොවේ. ඒ සතුට ලබා ගැනීමට නම් මිනිසා තමා මුණ ගැසෙන දහසකුත් එකක් කම්කටොලු වෙහෙස මහන්සි වී මහත් පරිශ්‍රමයකින් පිළිගෙන කට යුතු කළ යුතුව ඇත. ඒ සතුට අප මේ පොතේ තැනින් තැන සටහන් කළ අන්දමින් ඉතා පහසු කාරුණක් නොවේ. ඒ සතුට ලබා ගැනීමට නම් විශාල උනන්දුවක් සහ උත්සාහයක් අවශ්‍ය වේ. බොහෝසෙයින් උසස් ගති ගුණ සහ යහපත් කර්මයන් මත, නුසුදුසු සහ දුදන

ක්‍රියාවන්ගෙන් වැටී වෙලී නිරාවරණය වී පවතී. එහෙයින් ඒ අද්විතීය ගති ගුණ පැහැදිලි කර පිළිපැද අද්විතීය සම්පූර්ණ සතුටක් ලබා ගන්නට නම්, අසීරු නම් පාලම අඛණ්ඩ උත්සාහය නම් මරුවෙන් එගොඩ විය යුතුය.

යහ්යා බින් අබී කසීර් තුමා පවසන කියමනක් මුස්ලිම් තුමා සහීහ් මුස්ලිම් ග්‍රන්ථයේ මෙසේ විස්තර කරයි: 'කිසිවෙකුට කය මහන්සියෙන් තොර ඥානයක් ලබා ගැනීමට නොහැකිය'.

අප ඉහත විස්තර කරන ලද සතුට සහ එහි මහිමය මිනිසුන් දැන ගන්නේ නම් එය ලබා ගැනීමට අසිපත අමොරා ගෙන සටනට පවා සැරසෙනු ඇත. වත්මනයේ මිනිසා සතුටු වෙනුවෙන් කරන උත්සාහයන් අපමණය. නමුදු කරුණාබර අල්ලාහ් දෙවිඳු ඒ සතුට කා හට පිදිය යුතුයැයි මනාප වේද ඔහුට පමණක් එය පුද කිරීමට, ඒ සතුට අඥානය සහ ලෞකික ජීවිතයට වහල් වූ මිනිසා මුග්ධ ලෙස ප්‍රිය කරන පිළිකුල් දේවල්වලින් මුවා කර තබා ඇත. නියම සතුට මහත්වූ වරප්‍රසාධවලින් යුක්තයි.

සතුටට මග

සම්පූර්ණයෙන්ම අල්ලාහ් දෙවිඳුට කීකරු වී, ඔහු ප්‍රිය වී ඔහු පමණක් වන්දනාමානයට මුල් කර ගෙන, ඔහුගේ සාධකයන් සහ අනුග්‍රහයන් ගැන ප්‍රශංසාමුඛව සිතා බැලීමෙන් සෞභාග්‍යමත් ජීවිතයක් ඇති විය හැකි බව පැවසුවා නම් අපගෙන් බොහෝ දෙනෙකු එය එක්සිත්ව පිළිගැනීමට මැලි වී එය විවරණය සහිතව විස්තර කිරීම බලාපොරොත්තු වෙයි. එහෙයින් මිහිපිට මිනිසා සතුටු සෞභාග්‍යමත් ජීවිතයක් ලබා ගැනීමට

ඇති මාර්ගයන් අපමණය. අප එයින් සමහරක් පමණක් මෙහි විස්තර කිරීමට බලාපොරොත්තු වෙමි.

**ඒකෙශ්වර වාදය සහ දේව විශ්වාසය**

අතවැසියෙකුගේ අද්විතීය සතුට සහ සෞභාග්‍යය පවතින්නේ ඒක දේව දර්ශනයේ සම්පූර්ණත්වය සහ ඉස්ලාමීය විශ්වාස මූල ධර්මය අනුවයි. එසේ ඒ ඒක දේව වාදය සහ එහි ස්ථිර විශ්වාසයක් නොවන්නට ඔහුගේ සතුට සහ සෞභාග්‍ය කිසිවිටෙක ඔහු වෙත ළඟා වන්නේ නැත. ඒ ගැන සර්වබල දෙවිඳු අල්ලාහ් පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿ فَمَن يُرِدِ اللَّهُ أَن يَهْدِيَهُ يَشْرَحْ صَدْرَهُ لِلإِسْلاَمِ وَمَن يُرِدْ أَن يُضِلَّهُ يَجْعَلْ صَدْرَهُ ضَيِّقًا حَرَجًا كَأَنَّمَا يَصَّعَّدُ فِي السَّمَاءِ﴾

'අල්ලාහ් (සත්‍ය පසඳා) යමෙකු යහමග යවන්නට සිතන්නේද, ඔහුගේ සිත ඉස්ලාම් (ධර්ම) මගෙහි පුළුල් කරන්නේය. යමෙකු අයහමග යවන්නට සිතන්නේද, ඔහුගේ සිත ගුවනට නගින්නෙකු (ගේ සිත) මෙන් (අවහිර කර) හකුළු වන්නේය'. (අල්කුර්ආන් 6 : 125)

තවද අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿وَمَن يُؤْمِن بِاللَّهِ يَهْدِ قَلْبَهُ﴾

'යමෙකු අල්ලාහ් කෙරෙහි විශ්වාස කරයිද, (අල්ලාහ් දෙවිඳු වන) ඔහු ඔහුගේ සිත යහමග කරන්නේය'. (අල්කුර්ආන් 64 : 11)

පිරිසිදු චේතනාව

සෑම අවස්ථාවකදීම අනුන්ට උදව් කළ යුතුය යනුවෙන් තම සිත පිරිසිදු කර ඒ චේතනාවෙන්ම යමෙකු තම තත්ත්වය උසස් කර ගනීදෝ, අල්ලාහ් දෙවිඳු ඔහුට දෙ ලොවම සතුටෙන් පිරුණු සෞභාග්‍යමත් ජීවිතයක් ලබා දෙන්නේය. එසේම අල්ලාහ් අණ කළ අයුරු ආඥාවන් ඒ විලසින්ම කරද, වැළකීමට අණ කළ දේ වෙතින් වැලකීද, අනෙකුත් යහකම්වල හැකි අයුරෙන් නියැළීමට ද උත්සාහ කරන විට ඔහුගේ සිත පිරිසිදු වන්නේය.

දෛනික නැමදුම

උදේ ෆජ්ර් නැමදුම සිත් සතුටට විශේෂ රුකුලක් ලෙස පිළිගත හැකිය. නැමදුමෙහි නුවන් පිනවීමක්ද ඇති බව මුහම්මද් නබි තුමා පැවසූ වදනක් මේ පොතේ අප පෙර තැනක සඳහන් කළෙමු. මන්දයත් අනවැසියෙකු තම නැමදුම තුලින් තම දෙවිඳු විවෘතව මුණ ගැසෙන්නේය. තවද හෙතෙම තමාට අල්ලාහ් දෙවිඳු විසින් ලබා දී ඇති අනන්ත අප්‍රමාණ අනුග්‍රහයන් ගැන ස්තුති පූර්ව අන්දමින් මෙනෙහි කර ඒ වෙනුවෙන් යටහත් පහත්ව කටයුතු කරන්නේය. එසේම අල්ලාහ් දෙවිඳුට කරන වන්දනාමා නයන් තුලින් අල්ලාහ් දෙවිඳු වෙත සමීප වීමක්ද පතන් නේය. තම වන්දනාමානයන්හී, විශේෂයෙන්ම සුජූද් අවස්ථාව අල්ලාහ් දෙවිඳුට ඉතා සමීප අවස්ථාව හෙයින් ඒ අවස්ථාවේ හෙතෙම අල්ලාහ්ට සමීප වීමට හැකි සෑම උත්සාහයක්ම දරන්නේය. වරෙක මුහම්මද් නබි තුමා බිලාල් බින් රබාහ් අමතා 'බිලාල් දේව නැමදුම මගින් අප සන්සුන් කරනු' යනුවෙන් ඉල්ලා සිටියහ. (මූලාශ්‍රය : අබූදාවූද් සහ අහ්මද්)

එහෙයින් සත්‍ය විශ්වාස වන්තයෙකු නැමදුම් අවස්ථාව ලඟාවූ කල තමාගේ අන් සියලු ලෞකික කටයුතු පසෙක තබා කඩිනමින් නැමදුම ඉටු කිරීමෙන් හෙතෙම සතුටු සාගරයෙහි කිමිදෙන්නේය.

## සියල්ල සතුටෙන් පිළිගැනීම

යමෙකු තමා මුහුණු පාන්නට සිදුවන සියලු මාදිලියේ සිදුවීම් චින්ත වේදනාවෙන් තොරව එක සේ සතුටෙන් පිළිගන්නා විට ඔහුගේ සිත සතුටෙන් පිරී පවතින්නේය. එහෙයින් සත්‍ය විශ්වාස වන්තයෙකු ලෙඩ රෝගයට බිය වී හෝ දුප්පත්කම දැක චංචල වී හෝ නොසිට එවැනි ඕනෑම දුක් කරදරයක් පැමිණි අවස්ථාවක ඒවා සියල්ල එඩිතරව පිළි ගන්නේය. එසේ දුක්කරදරයක් පැමිණෙන විට තමාට පහළ මට්ටමේ පසුවන්නන් බලා තමාට දෙවිඳු දී ඇති අනුග්‍රහයන් සහ තත්ත්වය ගැන තෘප්තිමත් වී සතුටු වී ඒ වෙනුවට වෙනත් දෙයක් නොඅය දින්නේය. එමණක් නොව, තමා, තමා ගැන පරීක්ෂා කර තක්සේරු කර බලනවාට වඩා අල්ලාහ් දෙවිඳු තමා ගැන පරීක්ෂා කර බැලීම මනාය යනුවෙන්ද, තමාට තම දෙමාපියන්ගේ ආදර සහ කරුණාවට වඩා අල්ලාහ් දෙවිඳුගෙන් ලැබෙන ආදරය සහ කරුණාව අති උසස් බව වටහා ගන්නේය. එසේ තම දෙවිඳුගේ මහිමයන් ගැන වටහා ගෙන ප්‍රශංසාමුඛව කටයුතු කරන තාක් කල් ඔහු නියම සතුටක් සහ අද්විතීය තෘප්තියක් විඳින්නේය.

## දික්ර්හී යෙදීම

තවද අල්ලාහ් දෙවිඳු වැඩිවැඩියෙන් දික්ර් හෙවත් මෙනෙහි කිරීමෙහි යෙදීමෙන් ඔහුගේ සිත විවෘත වී සන්සුනක් සතුටක් ලබා ඒ මගින් සියලු දුක්කම් කටොලු

සහ කරදරයන් බොහෝ සෙයින් ඔහු වෙතින් ඉවත් වී යන්නේය. එසේ අල්ලාහ් දෙවිඳු ගැන මෙනෙහි කිරීම ගැන අල්ලාහ් දෙවිඳුම පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿الَّذِينَ آمَنُواْ وَتَطْمَئِنُّ قُلُوبُهُم بِذِكْرِ اللّهِ أَلاَ بِذِكْرِ اللّهِ تَطْمَئِنُّ الْقُلُوبُ﴾

'(යහමග ලබන) ඔවුන් කුමණ අය වෙ නම්, (සැබැවින්ම සම්පූර්ණ) විශ්වාස වන්තයින් ඔවුන්ය. තවද අල්ලාහ් සිහිකිරීමෙන් ඔවුන්ගේ සිත් පිනා යන්නේය. (මන්දයත්) සිත් පිනා යන්නේ අල්ලාහ් සිහි කිරී මෙන් බව දැන ගන්න'. (අල්කුර්ආන් 13 : 28)

ප්‍රයෝජනවත් ඥානය

දහම ගැනවූ මනා දැනුම මිනිසාගේ සිත ආලෝකමත් කර ඔහුගේ පටු ලොව පුළුල් කරන්නේය. නමුදු මුග්ධ ගතිය සහ අනුවණකම මිනිසාට තනිකම සහ හුදෙකලාවේ මනාපය ඇති කරන අතර, ඔහුට තම ජීවනමග සෘජු අන්දමින් සකස් කර ගැනීමට නොහැකි වන අයුරු බාධාවක්ද ඇති කරන්නේය.

මැවීම් සහ ක්‍රියා කිරීම

දෙවිඳුගේ අනෙකුත් මැවීම්වලට අප විසින් කළ යුතු යුතුකම් හරියාකාරව ඉටුකර, ඒවා සමග වූ සම්බන්ධයන් නියමාකාරයෙන් පවත්වා ගෙන යා යුතුය. එසේම සමාජය තුල ඒවාට අපෙන් ඉටුවිය යුතු යුතුකම් අතරින් මුදල් සම්බන්ධ සහ අනෙක් මාදිලියේ භාහිර උදව් උපකාර මනා අන්දමින් ඉටුකරන විට මිනිසා මසුරු කමෙන් තණ්හාවෙන් ඉවත්වී උසස් සිත් සතුටක් තෘප්තියක්

ලබන්නේය. යමෙකු මෙසේ තම යුතුකම් මනා ලෙස ඉටු කරන විට ඔහුගේ චින්තනය සහ සිත පුළුල් වී පරාර්ථකාමී වී අල්ලාහ් දෙවිඳුගේ අනුග්‍රහයන් සහ මහා කරුණාවන් හට භාජනය වන්නේය.

## අධික නින්ද, නුවුවමනා කතාව, අධික ආහාරය සහ නොමනා බැල්ම

යමෙකුගේ අධික නින්ද, අධික දුක, තමාට උවමනා ප්‍රමාණයට වඩා අධික ආහාර ගැනීම, නුවුවමනා කතා සහ අධික වාචාලකම, නුවුවමනා දේ බැලීම සහ ඇසීම වැනි කටයුතු නිසා අධික වේදනාව, කරදර වැනි අවස්ථා වන් හට භාජනය වී සමහර විට එය විශාල කණස් සල්ලක් අසතුටක් බවට පත් විය හැකිය. එසේ වූවා නම් සමහර විට ඔහු එයින් මිදීමට විශාල පරිශ්‍රමයක යෙදිය යුතුව ඇත. එහෙයින් එවැනි නුවුවමනා කටයුතු වලින් ඉවත් වීමෙන් විනා මිනිස් සිත සහගත සැහැල්ලු වී මනා සතුටක් නොලබන්නේය.

## අල්ලාහ් කෙරෙහි මනාප වී ඔහු වෙතම හැරීම

අනවැසියෙකු අල්ලාහ් කෙරෙහි ප්‍රිය වී සම්පූර්ණ බැති සිතෙන් ඔහු වෙත හැරී, වන්දනාමානයන් සියල්ල නිහත මානීව ඔහුට පමණක් සීමා කර කටයුතු කිරීමෙන් ලැබෙන සතුට සහ චිත්ත සන්සුන අන් කිසි ආකාරයකින් ලබා ගත නොහැකිය. තවද තම දෙවිඳු නිතර නිතර සිහිකිරීමෙන් වැළකී සිටීම සහ ඒවා කුසීත කමෙන් කරන්නන් වාලේ කිරීමද, අල්ලාහ් දෙවිඳු අනුමත නොකළ අන් කටයුත්තන්හි තම සිත යොමු කිරීමද, අල්ලාහ් දෙවිඳු හැර අසත්‍ය පිළිම රූප වැනිඅන් දේ

වන්දනාමාන කරන්නන් හා විවාහව එක්වී ප්‍රියමනාපව හැසිරීමද මිනිසාගේ සිත කරදරයට පත් කර නොසන් සුනක් ඇති කරවන ප්‍රධාන කරුණු ලෙස විස්තර කළ හැකිය.

පව් සමාව සහ පශ්චාත්තාපය

මිනිසා සෑම අවස්ථාවකම පව් සමාව අයැදීමෙහි තම සිත යොමු කිරීමෙන් සහ තමා කළ පව් සහ අනෙකුත් අයහපත් කටයුතු වෙනුවෙන් ඒ ගැන සිතා දුක් වී පශ්චාත්තාප වන කල ඔහුගේ සිත පිරිසිදු වී සැහැල්ලු වන්නේය.

අල්ලාහ් දෙවිඳු විසින් පුදා ඇති වරප්‍රසාධයන් වෙනුවෙන් නොපමාව තුති පුද කිරීම: මිනිසා සෑම මොහොතකම විශ්මිත විශ්වයක් තුළ ජීවත් වන්නේය. ඒ විශ්වය සහ එහි ඇති දේ, ඒවායේ සූක්ෂම නිර්මාණය සහ ක්‍රියාවීම වැනි තමා ලබා ඇති අති විශාල වරප්‍රසා ධයන් ගැන හැමවිටම අල්ලාහ් දෙවිඳුට බැතිසිතින් ප්‍රශංසා කළ යුතුය.

දුක්කරදර ඉවසීම

තමාට දුකක් කරදරයක් ඇතිවන කල ඒවා සියල්ල අල්ලාහ් දෙවිඳුගෙන් පැමිණෙන බවත්, ඔහුගේ පෙර නියම මත ක්‍රියාවන බවත් වටහා ගෙන ඉවසුමෙන් කටයුතු කළ යුතුය.

ප්‍රාර්ථනා සහ අල්කුර්ආනය පාරායනය කිරීම

තම තත්ත්වය ගැන සිතා හැකි සෑම අවස්ථාවකම අල්ලාහ් දෙවිඳුගෙන් ප්‍රාර්ථනා කිරීම සහ කුර්ආනය

පාරායනය කිරීම වැනි යහකම්වල නිතර නිතර යොමුවන කල බොහෝසෙයින් තමා වෙත පහසුවෙන් ලඟා වන දුක් කරදරවලින් මිදී සිත් සතුටක් ලබන්නේය.

සිතට වහල් නොවීම

අප සෑම විටකම අප සිතට වහල් නොවී සිතේ හැඟීම් වලට යටත් නොහී සිත දිනා ගැනීමට උත්සාහ කළ යුතුව ඇත. මිනිස් සිත් තුල පැන නගින අනේකවිධ ආශාවන්, ලැදියාවන් සහ මාත්චර්ය හැඟීම් වැනි මිනිස් සිත වක්‍ර කළ හැකි නොමනා ක්‍රියාවන්ගෙන් ඉවත් වී කටයුතු කළ යුතුය . එසේ කටයුතු කිරීමෙන් සහ අපගේ සියලු කටයුත්තන් අල්ලාහ් දෙවිඳු මත පවරා මහුගෙන්ම පිහිට පතා සිටින විට, අපගේ සිත් වේදනාව සහ දුක්ගැහැට ඉවත්වී, සිත පිරිසිදු වී මනා සතුටක සුවයක් විඳීමට හැකි වනු ඇත.

යහපත් අය හා ආශ්‍රය කිරීම

කුමන ගතිගුණවලින් සමන්විත අය අපගේ මිතුරන් ලෙස තොරා පත් කරමුද, කුමන මාදිලියේ පුද්ගලයන් සමග ආශ්‍රය කරමුද, පසුව අපද මවුන්ගේ ගතිගුණවලට ඇබ්බැහි වන්නන් බවට පත් වන්නට හැකිය. එය ස්වාභාවික විපර්යාසයකි. අප යහපත් ගතිගුණ සහ චරිත ඇති පුද්ගලයන් තොරා ගෙන මවුන් හා එක්වී ආශ්‍රය කරන්නේ නම් අපද යහපත් අය ලෙස පත්වන්නට හැක. අපගේ චරිතයද පිළිගත යුතු එකක් බවට පත් වන්නට හැකිය. දනන් හා ආශ්‍රය කරන විට අපද දුදනන් බවට පත්වන්නට හැකි අවස්ථා එමටය. එහෙයින් අප ආශ්‍රයට තොරා ගන්නන් යහකමෙන් සහ හොඳ ගති

පැවතුම් වලින් සමන්විත අය විය යුතුය.

## සෑම අවස්ථාවකදීම හොඳ වදන් පාවිච්චි කිරීම සහ සිත් කළකිරීමට පත් නොවීම

තමා මුහුණ දෙන සියලු කටයුත්තත් සහ දුක් කරදර අවස්ථාවන්හීදීම කළකිරීමට පත් නොවී කට යුතු කිරීම පිණිස සිත තර කර ගත යුතුය. එසේ නොවී යමෙකු පහසුවෙන් සිත් තැවුලට පත්වන්නේ නම් බිය සහ දුක මෙන්ම සිත් වේදනාවද ඔහු වෙත පහසුවෙන් සමීප විය හැකිය. ඔහුගේ චින්තනයන්ද අවුල් වියවුල් වන්නට හැකිය. මෙවැනි අවස්ථාවන්හී මුහම්මද් නබි තුමා කෙසේ කටයුතු කළාද යන්න ගැන අහ්මද් සහ බෙහකි ග්‍රන්ථයන් හී මෙසේ සඳහන් වේ. 'මුහම්මද් තුමා නිමිති බැලීමෙන් වැළකී හොඳ වදන් මගින් සිත් සන්සුන ලබන්නෙකු ලෙස කටයුතු කළහ'.

## දෙමාපියන්ට උවටැන් කිරීම සහ නෑයන් හා සුහදව කටයුතු කිරීම

කෙනෙකු තම දෙමාපියන්ට තමා විසින් ඉටු කළ යුතු යුතුකම නියම අන්දමින් ඉටු කළ යුතු අතර තම ළඟ සහ දුර නෑයන් සමගද සුහදව ආශ්‍රය කළ යුතුය. ඔහු එසේ කටයුතු කිරීමෙන් සිත් සතුටක් ඇති වී බොහො සෙයින් ඔවුන් වෙතින් බාහිර කරදර වැනි දේ අඩුවී සිත් සන්සුනක් ලබන්නේය. එසේ හැසිරීම අනුන් කෙරෙහි පරාර්ථකාමී ලෙස සහ ආත්ම පරිත්‍යාගයෙන් කටයුතු කිරීමටද සිත පුළුල් වන්නේය. තම දෙමාපියන්ට දුක් කරදර ඇතිකර ඔවුන්ගේ සිත රිදවා නෑදෑයන්ගේ සම්බන් ධකම් සිඳලමින් ඔවුන්ගෙන් ඉවත් වී වෙන්වී කටයුතු

කරන්නේ කවරෙක්ද ඔහුගේ සිත සෑම මොහොතකම කලබලයට, දුකට සහ කණස්සල්ලට පත් වන්නේය.

## සාදාරණ ඉපයීම

මිනිසා තමා අනුභව කරන, තම බිරිඳට සහ ළමයින්ට ආහාරපාන වෙනුවෙන් වියදම් කරන මුදල, ඉස්ලාම් දහම අනුමත කළ අයුරු උපයාගත් මුදලෙන් ගත් ඒවා විය යුතුය. එසේ නොවී ඔහුගේ කෑම්බීම්, ඇඳුම් පැළඳුම් සහ ඉඳුම්හිටුම් පිණිස වියදම් කරන මුදල් අනිසි ලෙස හෝ අපරාධ ලෙස උපයා ගත් ඒවා නම් ඔහුගේ සිත සහ කය දුදනෙන් පිරී නොසන්සුන් තත්ත්වයක් ඔහු තුල ඇති කර සෑම මොහොතකම ඔහුගේ සිත අසතුටෙන් පිරී පවතින්නේය. මන්දයත් ඔහු තම ශරීරය පෝෂණය කර වඩා ගත්තේ නොමනා අන්දමින් උපයාගත් මුදල් වලින් නිසාය. එසේම ඔහු ඒ මුදල උපයා ගැනීම පිණිස එළිපිටද රහසේද කළ වැරැදි කවදා හෝ එළිවන කල හෙතෙම එයින් ලැජ්ජාවට සහ පිළිකුලට පත්ව ඔහුගේ සිත සම්පූර්ණයෙන්ම කළකිරෙන්නේය.

## බිරිඳ අසල් වැසියා සහ වාහන

මුහම්මද් නබි (සල්) තුමා දෙසූ බව සඅද් බින් අබී වක්කාස් තුමා මෙසේ විස්තර කරයි : 'සිව් දේ මත සතුටු රඳා පවතී. ඒවා හොඳ ගුණවත් බිරිඳ, විශාල සුදුසු නිවහන, යහපත් අසල්වැසියා සහ සතුටු විය හැකි වාහනය යන්න වේ. දුදන බිරිඳ, අයහපත් අසල් වැසියා, හිරහැර වූ පටු නිවහන සහ නුසුදුසු වාහන අසතුටක් ගෙන දෙන සිව් කරුණු වේ'.

තවද අප මෙහි සඳහන් නොකළ සතුටු සහ සෞභාග්‍යය ගෙන දිය හැකි කරුණු රාශියක් වේ. ඒවාද මිනිසාගේ ජීවිතය සෞභාග්‍යමත් කිරීමට බොහෝ සෙයින් ඉවහල් වන්නේය. එමනිසා ඉස්ලාම් දහම කුමක් ගැන සඳහන් කරමින් ඒවායේ සතුටක්, සන්සුනක් සහ සෞභාග්‍යයක් ඇති බව පවසා තිබෙද්ද, ඒවා සියල්ල මිනිසා සතුටෙන්, සන්සුනෙන් සහ සමාදානයෙන් ජීවත්වීමට ඇති විවෘත මාර්ගයන් වේ. එසේම කුමක් ගැන විස්තර කර ඒවායේ අසතුට, නොසන්සුන, වේදනා, සාංකාව සහ කළකිරීම ඇති බව පවසා තිබේද්ද ඒවායෙන් වැළකී කටයුතු කිරීමට වග බලා ගැනීම අපගේ පරම යුතුකමකි.

එහෙයින් මුස්ලිම්වරු වන අප එවන් දුක මත වැටී ඇති මාර්ගය මනා ලෙස වටහාගෙන, හැකිතාක් අයුරින් එයින් ඉවත්වී සදා සෞභාග්‍ය ජීවිතයක් වෙනුවෙන්, ඉස්ලාම් පවසන මාර්ගය වන අල්කුර්ආනය සහ මුහම්මද් නබි (සල්) තුමාගේ ආදර්ශමත් සුමග මස්සේ පිරිසිදු චේතනාවෙන් දිවි මග ගෙවන්න කරුණාබර අල්ලාහ් දෙවිඳු අප සැමට අනුග්‍රහය දක්වත්වා!

මුහම්මද් තුමාටද, එතුමාගේ පවුලේ අයටද, එතුමාගේ ශ්‍රද්ධාවන්ත කලණ මිතුරන්දට සදා ශාන්තිය සහ සමාදානය උදා වේවා!

وصلى الله تعالى وسلم على نبينا محمد وعلى آله وصحبه وسلم.

## كتاب : السعادة

## محتويات الكتاب :


- المقدمة
- أوهام السعادة
- سعادة الغرب
- السعادة الحقيقية
- بشارات الوحي
- صور من السعادة
- تغلب على القلق
- عنوان السعادة
- جولة مع السعداء
- من أقوال السعداء
- طريق السعادة
- أسباب السعادة

مطابع الحميضي
تلفون: ٤٥٨١٠٠٠ - فاكس: ٤٥٩٣٢١٧

# السعادة

## -حقيقتها-صورها-أسباب تحصيلها-

## باللغة السنهالية

تأليف

القسم العلمي بدار الوطن

ترجمة

عبد الحكيم محي الدين

مراجعة

محمد ناصم




دار الورقات العلمية للنشر والتوزيع

ردمك: ٩٩٦٠-٨٤٣-٥١-١-٢

مطابع الحميضي ت ٤٥٨١ ف ٤٥٩٢٢١٧ الرياض